# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 10 ශ්‍රේණිය

## ගුරු මාර්ගෝපදේශය

(2015 සිට ක්‍රියාත්මක වේ.)



සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.
www.nie.lk

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## ගුරු මාර්ගෝපදේශය

## 10 ශ්‍රේණිය

(2015 සිට ක්‍රියාත්මක වේ.)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

සිංහල භාෂාව හා සාහිත්‍යය

10 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN : .........................

සිංහල භාෂා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හයවන සහ දහවන ශ්‍රේණි සඳහා හඳුන්වාදීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනාවන් ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිතා කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනාදි අංශයන් සඳහා අවශ්‍යවන්නා වූ මාර්ගෝපදේශය ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශය උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එමනිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීමෙන් වැඩ ලෝකයට අවශ්‍ය වන නිපුණතා හා කුසලතාවලින් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමය.

මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතනයේ සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ මගින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුරු මාර්ගෝපදේශ යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

# විෂයමාලා කමිටුව

උපදේශකත්වය හා අනුමැතිය : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

විෂය විශේෂඥ උපදෙස් :

මහාචාර්ය රත්නසිරි අරංගල,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.

මහාචාර්ය ජයන්ත අමරසිංහ,
රුහුණු විශ්වවිද්‍යාලය,
මාතර.

සම්බන්ධීකරණය : ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා
කථිකාචාර්ය.

ලේඛක මණ්ඩලය :

ඩී. ඩබ්. දිසානායක මහත්මිය
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි,
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ජී. මුණසිංහ මහතා
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

තිලිනි රත්නායක මහත්මිය
කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න මහතා
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ඒ. ඩී. රුවනි සිසිජා මහත්මිය
සහකාර කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂය ඉගැන්වීමේ ක්‍රියාවලිය සාර්ථක ව ඉටු කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීමේ අරමුණින් මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කර ඇත. ගුරු මාර්ගෝපදේශ භාවිත කිරීමට පෙර දී ඇති උපදෙස් කියවා එය භාවිත කරන ආකාරය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගත යුතු වේ.

නිපුණතා පාදක විෂයමාලාවක් යටතේ ඉදිරිපත් කර ඇති මෙම විෂය නිර්දේශයේ සෑම නිපුණතා මට්ටමක් සඳහා ම පාඩමක් ඉදිරිපත් කර ඇත. මෙහි ඇතුළත් සියලු ම පාඩම් ඉදිරිපත් කර ඇත්තේ නිපුණතාව, නිපුණතා මට්ටම, කාලච්ඡේද සංඛ්‍යාව ඉගෙනුම් පල, පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් ඇගයීම හා තක්සේරුකරණය ගුණාත්මක යෙදුම් යන මූලික අංගවලින් සමන්විත ව ය. ඉදිරිපත් කර ඇති සෑම පාඩමක් සඳහා ම පොදුවේ කාලච්ඡේද සංඛ්‍යාවක් දක්වා ඇතත් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී එදිනෙදා පාඩම් සඳහා පාඩම් සැලසුමක් ඔබ විසින් සකස් කර ගත යුතු ය. ශිෂ්‍යයාගේ දැනුම ආකල්ප කුසලතා වර්ධනය වන පරිදි විවිධ ඉගෙනුම් අවස්ථා නිර්මාණය කර ඉදිරිපත් කිරීමට ගුරුභවතා යොමු විය යුතු ය. ශිෂ්‍යයාට විවිධ වූ ඉගෙනුම් අත්දැකීම් ලබා ගත හැකි පරිදි පාඩම් සැලසුම් කර ගැනීම අවශ්‍ය ය. ගුණාත්මක යෙදවුම් යටතේ ඉදිරිපත් කර ඇති පොත පත ගුරුවරයාට පරිශීලනය සඳහා ය. නමුත් එම පොත පත අතරෙන් ශිෂ්‍යයාට සුදුසු පොත් පත් හඳුනා ගෙන ඒවා කියවීමට ශිෂ්‍යයන් යොමු කළ යුතු ය.

ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා නිශ්චිත ක්‍රමයක් මෙහි ඇතුළත් කර නැත. ඔබට නිර්මාණශීලී ව ඉගැන්වීමේ ශිල්ප ක්‍රම භාවිත කිරීමේ අවස්ථාව ඇත. සම්ප්‍රේෂණ ගුරු භූමිකාව ඃඔර්බ්පසිසඥබ* ගනුදෙනු ගුරු භූමිකාව ඃඔර්බ්ජඑසඥබ* පරිණාමන ගුරු භූමිකාව ඃඔර්බදෙරප්එසඥබ* යන භූමිකාවලින් එකක් හෝ කිහිපයක් භාවිතා කරමින් ඉගැන්වීමෙහි නිරත විය හැකි ය. කුමන ගුරු භූමිකාවක නියලුණ ද ශිෂ්‍යයාට ඉගෙනීම සඳහා ක්‍රියාකාරි ඉගෙනුම් පරිසරයක් පන්තියේ නිර්මාණය කළ යුතුය. ශිෂ්‍යයන්ගේ නිර්මාණශිලී කුසලතා හඳුනාගෙන ඒවා වර්ධනය කර ගැනීමට අවස්ථාව සැලැස්වීම වැදගත් වේ. මේ සඳහා පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් යටතේ ක්‍රියාක්මක කරන දේශන වාද විවාද සාකච්ඡා ප්‍රදර්ශන ක්ෂේත්‍ර චාරිකා ගවේෂණ ආදි විවිධ වැඩසටහන් යොදා ගත හැකි ය.

නූතන තාක්ෂණයේ දියුණුවත් සමග ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ද තාක්ෂණය හා බද්ධ කර ගැනීමේ අවශ්‍යතාව පැන නැගී ඇත. හැකි සෑම අවස්ථාවක දීම නූතන තාක්ෂණය ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යය සඳහා යොදා ගැනීමට යොමු විය යුතු ය. ගුණාත්මක යෙදවුම් යටතේ මෙහි දක්වා ඇති පොත පත ගුරු භවතාගේ පරිශීලනය සඳහා ය. එසේ වුව ද මේ අතරින් ශිෂ්‍යයන්ගේ පරිශීලනය සඳහා සුදුසු පොත පත කියවීමට යොමු කළ යුතු ය.

ඇගයීමේ හා තක්සේරුකරණ ක්‍රියාවලිය සඳහා සෑම පාඩම් ඒකකයක් අවසානයේ දී නිර්ණායක ඉදිරිපත් කර ඇත. එම නිර්ණායක මැනෙන පරිදි සුදුසු ඇගයීම් වැඩ පිළිවෙළක් සකසා ගත යුතු ය. ශ්‍රවණ හා කථන කුසලතා ඇගයීම සඳහා වාචික පරීක්ෂණ භාවිත කිරීම අත්‍යවශ්‍ය ය.

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් විෂය ඉගැන්වීම සඳහා උපදෙස් ලබා දී ඇතත් ඉගැන්වීමේ ක්‍රම දක්වා නැත. ඔබට හා ඔබේ ශිෂ්‍යයන්ට උචිත ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රම නිර්මාණය කර ගැනීමට පූර්ණ අවකාශය සලසා ඇත. මේ උපදෙස් පිළිපදිමින් සාර්ථක ව ඉගැන්වීමේ ක්‍රියාවලියෙහි යෙදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ලේඛක මණ්ඩලය

# පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| පටුන | vii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | viii - xxx |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 - 40 |
| විවිධ සහාය | 41 |

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## විෂය නිර්දේශය

## 10 ශ්‍රේණිය

(2015 සිට ක්‍රියාත්මක කෙරේ)

සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
භාෂා මානව හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව.

විෂය විශේෂඥ සහාය

මහාචාර්ය රත්නසිරි අරංගල ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, නුගේගොඩ
මහාචාර්ය ජයන්ත අමරසිංහ රුහුණු විශ්ව විද්‍යාලය, මාතර

විෂය නිර්දේශ කමිටුව
එස්. ඒ. පේමසිරි මහතා, ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මහතා, කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

පූජ්‍ය කුකුරම්පොළ ඤාණවිමල හිමි, කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

එම්. ජී. මුණසිංහ මහතා, කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ටී. එම්. රත්නායක මහත්මිය, කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

ඩබ්ලිව්. පී. මංගල ගුණරත්න මහතා, සහකාර කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

පී. ඒ. ඩී. රුවනි සිසිජා කල්දේරා මහත්මිය, සහකාර කථිකාචාර්ය, සිංහල දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය.

එස්. ඕ. ප්‍රනාන්දු මහතා, අධ්‍යක්ෂ (විශ්‍රාමික) ජාතික අධ්‍යාපන ආයතනය.

එච්. එල්. එස්. අබේවික්‍රම මහත්මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ,
ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය

ප්‍රගීතිකා ජයසේකර මහත්මිය, සහකාර කොමසාරිස්
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය.

එච්. පී. සුසිල් සිරිසේන මහතා, කථිකාචාර්ය, හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, මීරිගම

ස්වර්ණා වීරසිංහ මහත්මිය, ගුරු උපදේශිකා කලාප අධ්‍යාපන කාර්යාලය
කැලණිය

වයි. පී. එන්. පී. විමලසිරි මිය, ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය ,
ජයවර්ධනපුර

ගයා වැයිහේන මහතා, ගුරු උපදේශක, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පාදුක්ක

සුනිල් බියන්විල මහතා, ගුරුසේවය ගිරි/වික්‍රමශිලා ජාතික පාසල, ගිරිඋල්ල.

අරුණ ඉන්දික වේරගල මහතා, ගුරු සේවය. කො/ආනන්ද බාලිකා විද්‍යාලය
කොළඹ 10.

# පටුන


| | පිටු අංක |
|---|---|
| හැඳින්වීම | ං ස |
| ජාතික පොදු අරමුණු | xii |
| මූලික නිපුණතා | xiii - xiv |
| විෂය අරමුණු | xv |
| විෂය නිර්දේශය | xvi - xxx |

හැඳින්වීම

අනාගත ලෝකයේ අභියෝග ජයගැනීමට සමත් දරු පරපුරක් රටට දායාද කිරීමේ කාර්ය භාරයේ වැඩි වගකීම හිමිවන්නේ අධ්‍යාපනයට ය. ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වන දැනුම උකහා ගැනීම සඳහා අවශ්‍ය භාෂා කුසලතා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය කරුණකි. සිංහල භාෂාව, ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ ප්‍රධාන මාධ්‍ය භාෂාව වේ. සිංහල භාෂාව ඇතුළු ව අනෙකුත් විෂය හැදෑරීම සඳහා සිංහල භාෂාව පිළිබඳ නිවැරදි දැනුම අත්‍යවශ්‍ය ය. භාෂාවේ චතුර්විධ කුසලතා වර්ධනය කර ගැනීමෙන් විෂය සාධන මට්ටම ඉහළ තලයකට නංවාලිය හැකි ය. සියලු විෂයන්හි සාධන මට්ටම වර්ධනය සඳහා භාෂා දැනුම අවශ්‍ය හෙයින් සිංහල භාෂාව පිළිබඳ කුසලතා සංවර්ධනය කිරීම මවුබස සිංහල විෂයේ වගකීමක් ලෙස හඳුනා ගෙන ඇත.

සිංහල භාෂාව සියවස් ගණනාවක් තුළ වැඩෙමින් විකාශනය වූ භාෂාවකි. ඒ නිසා ම එහි විවිධ වාක්‍ය රීති මෙන් ම භාෂා ව්‍යවහාර ද දක්නට ලැබේ. ඒවා අධ්‍යයනය කිරීමෙන් භාෂා මාමාකත්වයෙන් යුතු ව කටයුතු කිරීමට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිංහල සාහිත්‍යය, සිංහල භාෂා විෂය සමග ඒකාබද්ධ වූ විෂය කොටසකි. දයාව, කරුණාව ආදි මානව ගුණධර්මවලින් හෙබි සුබනම්‍ය මනසකින් හා සමබර පෞරුෂයකින් යුතු සංවේදී දරු පරපුරක් බිහි කිරීම සඳහාත් සාහිත්‍ය සේවනය අත්‍යවශ්‍ය සාධකයකි.

නව විෂය නිර්දේශය සකස් කිරීම සඳහා දැනට ක්‍රියාත්මක විෂය නිර්දේශය පාදක කරගෙන ඇත. ඒ අනුව නව විෂය නිර්දේශය ද නිපුණතා පාදක ව ඉදිරිපත් කෙරේ. මෙම විෂය නිර්දේශය සකස් කිරීමේ දී ආචාර්ය ජැනට් රෙනෝල්ඩ්ස් මහත්මියගේ සහ ආචාර්ය සෙනරත් නානායක්කාර මහතාගේ ශ්‍රී ලංකාවේ 6 - 9 ශ්‍රේණි සඳහා විෂය ප්‍රමිති රාමුව (Standards for grade 6 - 9 subjects in Sri Lankan Schools. Authors Dr. Janet Reynolds and Dr. Senarath Nanayakkara) නමැති ලේඛනයේ ඇතැම් අංග උචිත පරිදි යොදා ගෙන ඇත.

## ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලිය තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනයෙන් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I	මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩ ගැනීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.

II	වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III	මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV	පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V	සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI	පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය මගින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII	ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැස්වීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII	ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් කර ගනී.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමය පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීව ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව

ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම,
යන හැකියා උපරි ම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාව මගින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

විෂය අරමුණු

1. චතුර්විධ භාෂා කුසලතා හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය කර ගැනීම.

2. නිරවද්‍ය හා සම්මත භාෂා භාවිතයෙහි පරිචිත භාවය අත්පත් කොට ගැනීම.

3. සාහිත්‍ය පරිශීලනයෙන් නිර්මාණාත්මක ලේඛන ශෛලී හා ශිල්පීය මූලධර්ම පිළිබඳ දැනුම හා අවබෝධය ලබා ගැනීම සහ වාංමාලාව පෝෂණය කර ගැනීම.

4. විශ්වවිශ්‍රැත සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානය උකහා ගත හැකි වන පරිදි අවබෝධාත්මක පරිශීලනයට යොමු කිරීම.

5. සාහිත්‍ය කෘති පරිශීලනයෙන් සාහිත්‍ය විචාර මූලධර්ම අවබෝධ කොට ගෙන වින්දනාත්මක හා විචාරාත්මක කුසලතා වර්ධනය කරගනිමින් රසාස්වාදයට යොමු වීම හා ජීවිත පරිඥානය අත්පත් කොට ගැනීම.

6. සිංහල සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ දැනුම පුළුල් කරගනිමින් සමාජ, සංස්කෘතික වටිනාකම් හඳුනා ගැනීම සඳහා පුරාතන හා නූතන සිංහල සාහිත්‍ය කෘති පරිශීලනය.

07. සාහිත්‍යයේ පදනම වන භෂාවෙන් නිරූපිත භාෂාමය අනන්‍යතාව හා තදනුබද්ධ සංස්කෘතික අනන්‍යතාව හැදෑරීම.

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි. | 1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි. | • සම්භාව්‍ය පද්‍ය සාහිත්‍යයෙන් උද්ධෘතයක් (ගුත්තිල කාව්‍යය ඇසුරෙන්)<br>• නාට්‍ය ගී<br>• අන්න බලන් සඳ - කුණ්ඩලකේසී වේදිකා නාට්‍යය (මහගමසේකර) | • සාහිත්‍ය නිර්මාණවලට සවන් දී අර්ථ ප්‍රකාශ කරයි.<br>• සාහිත්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් විස්තර කරයි.<br>• සාහිත්‍ය නිර්මාණවල භාෂා භාවිතය පිළිබඳ කරුණු දක්වයි.<br>• නිර්දිෂ්ට ගීත හා පද්‍ය නිර්මාණවලට සවන් දී රස වින්දනයේ යෙදෙයි.<br>• සාහිත්‍යමය යෙදුම්වල අවස්ථෝචිත බව විමර්ශනය කරයි.<br>• අදාළ සාහිත්‍ය නිර්මාණය අයත් වන සාහිත්‍ය ක්ෂේත්‍රය හා එහි විශේෂතා ඉදිරිපත් කරයි. | 03 |
| | 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි. | • ශාස්ත්‍රීය සංවාද, සාකච්ඡා<br>• කාලීන ගුවන් විදුලි හා රූපවාහිනී ශාස්ත්‍රීය සංවාද/සාකච්ඡා සංහිඳ රජරට සේවය, තුන්පත් රටා, ස්වදේශීය සේවය, රූපණ අධ්‍යාපන සේවය ආදි ගුවන් විදුලි වැඩසටහන් ඇසුරින් | • අවධානයෙන් යුතු ව සවන් දීමෙන් අවශ්‍ය තොරතුරු එක්රැස් කරයි.<br>• රැස් කර ගත් තොරතුරු අවස්ථෝචිත ව යොදා ගනියි.<br>• සවන් දී තොරතුරු රැස් කිරීම අගය කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.5 දේශන, සාකච්ඡා ආදියට විචාරශීලී ව සවන් දීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | ● විද්වත් දේශන, විවාද හා සාකච්ඡා<br>• තෝරාගත් ගුවන් විදුලි වැඩසටහනක් ඇසුරෙන් (සුබස් මිණි අර) | ● දේශන, සාකච්ඡා ආදියට සහභාගිවීමේ කැමැත්ත ප්‍රකාශ කරයි.<br>● දේශන සාකච්ඡා ආදියට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.<br>● විචාරාත්මක ව තම අදහස් ප්‍රකාශ කරයි.<br>● දේශන සාකච්ඡාවල ඇතුළත් වැදගත් කරුණු ඉදිරිපත් කරයි. | 03 |
| | 1.6 නිරවුල් ව හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි. | ● මාතෘකානුකූල කතා<br>• අවස්ථෝචිත කතා (හෙළදිව අතීත ප්‍රතිරාව, ආනන්ද ගුරුගේ - කෘතියෙන් තෝරා ගත් කතාවක්)<br>● ක්ෂණික කතා<br>● විවාද | ● සාර්ථක කතාවක තිබිය යුතු ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>● සබකෝලයෙන් තොර ව කතා කරයි.<br>● නිවැරදි ව හා පැහැදිලි ව කතා කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>● තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කරයි.<br>● නිවැරදි උච්චාරණයෙන් හා උචිත අංග චලන භාවිත කරමින් කතා කරයි.<br>● සෙසු අයගේ අවධානය දිනා ගනිමින් කතා කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.7 බහු විධ මාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | ● භූමිකා රංගන<br>● ඉදිරිපත් කිරීම සඳහා මාධ්‍ය භාවිතය<br>- පෝස්ටර් - (Posters)<br>- පිටුපෙරළන - (Flip Charts)<br>- සාමූහික ඉදිරිපත් කිරීම්<br>- උහිස් ප්‍රක්ෂේපය - (Over Head Projector)<br>- බහුමාධ්‍ය ප්‍රක්ෂේපය - (Multi - Media Projector) | ● ඉදිරිපත් කිරීම සඳහා යොදා ගත හැකි විවිධ මාධ්‍ය පැහැදිලි කරයි.<br>● විවිධ මාධ්‍ය භාවිත කරමින් ඉදිරිපත් කිරීමේ හැකියාව අගය කරයි.<br>● බහු විධ මාධ්‍ය භාවිත කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.<br>● තාක්ෂණික මෙවලම් භාවිත කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | 04 |
| 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. | 2.2 විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි. | ● බුත්සරණ, නාලාගිරි දමනය කතාවෙන් කොටසක්,<br>- අමාවතුර නාලාගිරි දමනය කතාවෙන් කොටසක්<br>- පූජාවලිය නාලාගිරි දමනය කතාවෙන් කොටසක් | ● පොතපත කියවීමේ දී ශෛලීය විවිධතා හඳුනා ගෙන කියවයි.<br>● අසන්නාට ප්‍රිය උපදවන පරිදි පැරණි සාහිත්‍ය නිර්මාණය කියවයි.<br>● නිවැරදි හා ශබ්ද උච්චාරණය කෙරෙහි අවධානය යොමු කරමින් හඬ නගා කියවයි.<br>● අසන්නන්ගේ අවධානය දිනා ගනිමින් පොත පත කියවයි.<br>● පොත පත කියවා එහි විවිධ ශෛලි අගය කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.3 නිශ්ශබ්ද ව කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි. | ● ශාස්ත්‍රීය ලිපි<br>● චරිත කතා<br>- සේනක බිබිලේ (පූජිත ජීවිත කෘතිය ඇසුරෙන්) | ● විවිධ විෂයන්ට අදාළ ලේඛන කියවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>● විවිධ ලේඛන කියවීමෙන් අවබෝධ කර ගත් කරුණු ඉදිරිපත් කරයි.<br>● පොත පත කියවීමෙන් පුළුල් කර ගත් වාක් කෝෂය භාෂා කාර්යයේ දී භාවිත කරයි.<br>● නිශ්ශබ්ද ව පොත පත කියවීම අගය කරයි. | 04 |
| 3.0 සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි. | 3.1 සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි. | ● ඝෝෂ අඝෝෂ අක්ෂර<br>● අන්තස්ථාක්ෂර<br>● අනුස්වාරය<br>● විසර්ගය<br>● ඌෂ්මාක්ෂර<br>● ෆ අක්ෂරය | ● සිංහල අක්ෂරමාලාව නිවැරදි ව අනුපිළිවෙළින් ඉදිරිපත් කරයි.<br>● ඝෝෂ, අඝෝෂ භේදය හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>● අන්තස්ථාක්ෂර හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>● අනුස්වාරය හා විසර්ගය හඳුනාගෙන නිවැරදි ව භාවිත කරයි.<br>● ඌෂ්මාක්ෂර හඳුනා ගෙන භාෂා කාර්යයේ දී නිවැරදි ව යොදා ගනියි.<br>● භාෂා කාර්යයේ දී 'ෆ' අක්ෂරය නිවැරදි ව යොදා ගනියි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.2 ප්‍රායෝගික භාෂා කාර්යය මැනවින් ඉටුකර ගැනීම සඳහා සිංහල අකාරාදි පිළිවෙළ භාවිත කරයි. | • ශබ්ද කෝෂ භාවිතය<br>• ආකාරාදි පිළිවෙළට වචන සකස් කිරීම | • අකාරාදි පිළිවෙළ මතකයෙන් ලියයි.<br>• වචනාර්ථ, අක්ෂර වින්‍යාසය පරීක්ෂා කිරීම සඳහා ශබ්දකෝෂ භාවිත කරයි.<br>• ශබ්දකෝෂ පහසුවෙන් පරිහරණය කරයි.<br>• අකාරාදි පිළිවෙළට අනුව වචන පෙළ ගස්වයි.<br>• ශබ්දකෝෂ පරිහරණය අගය කරයි. | 02 |
| | 3.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි. | • අක්ෂර වින්‍යාස රීති හා භාවිතය ලේඛන නිවැරදි කිරීම. | • අක්ෂර වින්‍යාසය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලියයි.<br>• ලේඛනයේ දී අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම අවශ්‍ය බව ප්‍රකාශ කරයි.<br>• අක්ෂර වින්‍යාසය අනුව වචනයක අර්ථ වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.<br>• ලේඛනවල අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීම අගය කරයි. | 02 |
| 4.0 ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 4.1 විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි. | • විරාම ලකුණු නිවැරදි ව භාවිත කිරීම. (ක්‍රියාකාරකම්) | • විරාම ලකුණු නිවැරදි ව හඳුනා ගෙන නම් කරයි.<br>• ලේඛනයේ දී විරාම ලකුණු අර්ථවත් ව භාවිත කරයි.<br>• නිවැරදි ව විරාම ලකුණු භාවිතය අගය කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 පද බෙදීමේ රීති අනුගමනය කරමින් ලියයි. | ● උපකාරක ක්‍රියා පද වෙන් කිරීම.<br>● දී නිපාතය වෙන් කිරීම. | ● ' පදය ' යන ව්‍යාකරණමය ඒකකය හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>● වාක්‍යයක පද, ස්ථාන ගත කළ යුතු ශෛලි හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>● උපකාරක ක්‍රියා පද වෙන් කොට හෝ එක්කොට හෝ ලිවීම පිළිගනී.<br>● ' දී ' නිපාතය වෙන්කොට ලියයි. | 02 |
| 5.0 භාෂාමය කාර්යයේ දී වාක් කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි. | 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි. | ● වාක් කෝෂය<br>• ආපදා කළමනාකරණය, මානව විද්‍යාව, තාක්ෂණය ආදි විෂය ක්ෂේත්‍ර ඇසුරෙන් | ● විවිධ ලිපි ලේඛන කියවා වාක්කෝෂීය විවිධතා ඉදිරිපත් කරයි.<br>● වචනවල අර්ථය අදාළ අවස්ථාව හා සිද්ධිය සම්බන්ධ වන බව ප්‍රකාශ කරයි.<br>● භාෂා භාවිතයේ දී එම වචන අර්ථවත් ව යොදයි. | 02 |
| | 5.2 සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයයේ දී උචිත පරිදි භාවිත කරයි. | ● ප්‍රස්තාව පිරුළු, රූඪී, (ඉඟි වැකි), යුගල පද, (ක්‍රියාකාරකම් | ● ප්‍රස්තාව පිරුළු, රූඪී, යුගල පද ආප්තෝපදේශ ආදි සාම්ප්‍රදායික යෙදුම් හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>● සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරමින් රසවත් ව අදහස් කරයි.<br>● ලේඛනයේ දී සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.3 භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනා ගෙන භාෂාව භාවිත කරයි. | ● විවිධ පළාත් අනුව භාෂා ව්‍යවහාර සුගතපාල ද සිල්වා<br>- ඇන්. ටී. කරුණාතිලක<br>- ජේ. බී. දිසානායක<br>- කේ. බී. මානෑව<br>- පියසේන කහඳගම<br>- බදගිරියේ අබේසිරිවර්ධන<br>ආදි ලේඛකයන්ගේ නිර්මාණ ඇසුරෙන් | ● සමාජයක භාෂා ව්‍යවහාරයේ ප්‍රභේද පවත්නා බව ප්‍රකාශ කරයි.<br>● භාෂා ව්‍යවහාරවල ප්‍රභේද, අදාළ සමාජ කණ්ඩායම්වල අනන්‍යතාව පළ කරන බව ප්‍රකාශ කරයි.<br>● විවිධ භාෂා ව්‍යවහාර භාවිත කරන සමාජ කණ්ඩායම් ඇති බව ප්‍රකාශ කරයි.<br>● විවිධ වෘත්තීන් හා බැඳුණු භාෂා ව්‍යවහාර ඇති බව ප්‍රකාශ කරයි.<br>● හඳුනාගත් වචන ඇසුරෙන් සන්නිවේදනයේ යෙදෙයි.<br>● විවිධ භාෂා ව්‍යවහාර අගය කරයි. | 02 |
| 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි. | 6.1 නාම පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි. | ● ප්‍රකෘති - නාම, ක්‍රියා<br>(ක්‍රියාකාරකම් ) | ● නාම පදවල ප්‍රකෘති හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>● ප්‍රකෘති භාවිත කරමින් නාම පද සකස් කරයි.<br>● නාම ප්‍රකෘති, භාෂාවේ යෙදෙන අවස්ථා පැහැදිලි කරයි. | 04 |
| | 6.2 ක්‍රියා පද හා එහි ප්‍රභේද පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි. | ● ක්‍රියා පද<br>(ක්‍රියාකාරකම් ) | ● ක්‍රියා පද වර්ග පිළිබඳ මතකය අවදි කරමින් සාකච්ඡා කරයි.<br>● වාක්‍යයක අවසාන ක්‍රියාව පැහැදිලි කරයි.<br>● වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය, කාල භේදය ආදි වශයෙන් අවසාන ක්‍රියාව යෙදෙන අයුරු දක්වයි.<br>● වාක්‍ය නිර්මාණයේ දී ක්‍රියා පදයේ ඉහත අවස්ථා කෙරෙහි අවධානය යොමු කළ යුතු බව ප්‍රකාශ කරයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.3 අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි. | ● අව්‍යය පද (ව්‍යවහාරයේ භාවිත වන උපසර්ග) | ● අව්‍යය පද හඳුනාගෙන නම් කරයි.<br>● අව්‍යය පද නිපාත සහ උපසර්ග වශයෙන් වෙන් කර දක්වයි.<br>● උපසර්ග පද යෙදී ඇති වචන හඳුනාගෙන භාවිත කරයි.<br>● උපසර්ග වචනයක මුලට යෙදී, අර්ථ ප්‍රකාශ කරන බව පවසයි. | 04 |
| | 6.4 පද නිවැරදි ව සන්ධි කරයි. | ● ව්‍යවහාරයේ පවතින සන්ධි (ක්‍රියාකාරකම්) | ● භාෂාවේ සන්ධි යනු කුමක්දැයි පැහැදිලි කරයි.<br>● සන්ධි විධි හඳුනාගෙන නම් කරයි.<br>● භාෂාවේ ශබ්ද මූලික කර ගෙන සන්ධි කාර්ය සිදු වන බව ප්‍රකාශ කරයි.<br>● උච්චාරණයේ පහසුව සඳහා පද සන්ධි වන බව පවසයි.<br>● ලේඛනය සඳහා සන්ධි පද යොදා ගනියි.<br>● පද විසන්ධි කිරීමෙන් වචනාර්ථ දැන ගනියි. | 05 |
| | 6.5 සම්මත රීතිවලට අනුගතව වාක්‍ය ලියයි. | ● කර්තෘ කාරක කර්ම කාරක වාක්‍ය<br>● විශේෂ වාක්‍ය රීති<br>- පූර්ව ක්‍රියාවට හා කෘදන්තයට පරව 'ච' ධාතුව යෙදෙන අවස්ථා<br>- තෙමේ, තොමෝ, තුමූ යන සර්වනාම ද, ඇයි, කෙසේ, කවදා, මොනවා යන ප්‍රශ්නාර්ථ ද, යුතු වනාහි නිපාත යෝග සහිත වාක්‍ය<br>- ද්විත්ව උක්තය සහිත වාක්‍ය | ● විවිධ වාක්‍ය හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>● කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය නිවැරදි ව ලියයි.<br>● උක්තය කර්මය හා ආඛ්‍යාතය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.<br>● කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය රීති අනුගමනය කරමින් නිවැරදි ව ලේඛනයේ යෙදෙයි.<br>● විවිධ රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි. | 05 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 7.1 තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි. | ● රාජකාරි ලිපි<br>● ව්‍යාපාරික ලිපි (ක්‍රියාකාරකම්) | ● විවිධ ලිපි ආකෘති හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● ලිපියෙහි ව්‍යූහමය නිරවද්‍යතාව හා නිශ්චිත අරමුණකට යොමු වන බව පවසයි.<br>● ශිල්පීය ප්‍රයෝග උපයෝගි කර ගනිමින් ලියයි.<br>● ලිපි ලිවීමේ දී යෝග්‍ය ආකෘති භාවිත කරයි. | 04 |
| | 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි. | ● වාර්තා<br>● සටහන් (Memo)<br>● අත්පත්‍රිකා<br>● න්‍යායපත්‍ර<br>● දැන්වීම් | ● ප්‍රායෝගික ලේඛන හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>● ශිල්පීය ප්‍රයෝගානුකූල ව ප්‍රායෝගික ලේඛන සකස් කරයි.<br>● අදාළ ලේඛනයට යෝග්‍ය නිර්මාණාත්මක අංග භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි. | 04 |
| 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි. | 8.1 කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි. | මාතෘකානුකූල රචනා | ● ලේඛනකරණයේ නිතරවීමට අපේක්ෂිත මාතෘකාවට අදාළ ව විචාරාත්මක, විමර්ශනාත්මක හා ගවේෂණාත්මක ව කරුණු ඒකරාශි කරයි.<br>● විචාරාත්මක , විමර්ශනාත්මක හා ගවේෂණාත්මක මාතෘකාවලට අදාළ ව කරුණු සංවිධානය කරමින් ලියයි.<br>● භාෂාත්මක යෙදුම් උචිත පරිදි භාවිත කරමින් ලියයි.<br>● සම්මත ව්‍යාකරණානුකූල ව ලේඛනයේ යෙදෙයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 8.2 පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි. | ● පුවත්පත් විශේෂාංග ලිපි | ● විචාරාත්මක, විමර්ශනාත්මක හා ගවේෂණාත්මක මාතෘකාවලට අදාළ ව කරුණු සංවිධානය කර ගනිමින් විශේෂාංග ලිපි ලියයි.<br>● ලේඛනයේ දී භාෂාත්මක යෙදුම් උචිත පරිදි භාවිත කරයි.<br>● සම්මත ව්‍යාකරණානුකූල ව ලේඛනයේ යෙදෙයි. | 03 |
| | 8.3 ලේඛන සාරාංශකරණයේ යෙදෙයි. | ● ලේඛන සාරාංශකරණය (ක්‍රියාකාරකම්) | ● ලේඛන අවබෝධයෙන් යුතු ව කියවයි.<br>● වැදගත් කරුණු සටහන් කර ගනියි.<br>● සාරාංශකරණ මූලධර්ම විස්තර කරයි.<br>● කියවීමෙන් ග්‍රහණය කර ගත් කරුණු සාරාංශකරණ මූලධර්මවලට අනුකූල ව සංක්ෂිප්ත කර ඉදිරිපත් කරයි.<br>● අදහස් සංක්ෂිප්ත කරමින් ලියයි. | 03 |
| 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහ ජීවනය හා ජාතිකාභිමානය ගොඩ-නගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි. | 9.1 සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි. | ● ජාතික උරුමය ගැන ලියවුණු ලිපියක්<br>● (වල්පොළ රාහුල හිමියන්ගේ ලංකාවේ බුදුසමයේ ඉතිහාසය කෘතිය ඇසුරෙන්) | ● නිර්දිෂ්ට ලේඛන කියවා සංස්කෘතික උරුමය පිළිබඳ අදහස් දක්වයි.<br>● සංස්කෘතිකාංගවලින් ඉස්මතු වන සාරධර්ම අගය කරයි.<br>● සංස්කෘතික උරුමය රැක ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.2 පොතපත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි. | ● විවිධ වෘත්ති ආශ්‍රිත සාරධර්ම (පොතපත ඇසුරින්) | ● ජන ජීවිතය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>● හේන් ගොවිතැන හා බැඳුණු සිරිත් විරිත් විස්තර කරයි.<br>● සාම්ප්‍රදායික වෘත්ති හා බැඳුණු සාරධර්ම අගය කරයි.<br>● විවිධ වෘත්ති හා සම්බන්ධ සිරිත් පැහැදිලි කරයි. | 03 |
| | 9.3 දේශාභිමානි හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි. | ● දේශාභිමානය දනවන පද්‍ය නිර්මාණ | ● දේශාභිමානී හැඟීම් දනවන පද්‍ය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>● දේශාභිමානය දනවන යෙදුම් පැහැදිලි කරයි.<br>● දේශාභිමානී හැඟීම් දනවන යෙදුම් අර්ථවත් ව භාෂාවේ භාවිත කරයි.<br>● දේශාභිමානී පද්‍ය අගය කරමින් කතා කරයි. | 03 |
| | 9.4 විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් හඳුනා ගැනිම සඳහා කියවයි. | ● හින්දු සිරිත් විරිත් පිළිබඳ ලියැවුණු ලිපියක් | ● පොත පත පරිශීලනයෙන් හඳුනාගත් හින්දු සිරිත් විරිත් පැහැදිලි කරයි.<br>● හින්දු සිරිත් විරිත් පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>● හින්දු සිරිත් විරිත් පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 | 9.5 විවිධ නායකයන්ගේ චරිත කතා පරිශීලනය කරයි. | ● ඉස්ලාම් නායකයකු ගේ චරිතය (පූජිත ජීවිතය කෘතිය ඇසුරෙන්) | ● ඉස්ලාම් නායකයකු පිළිබඳ තොරතුරු විස්තර කරයි.<br>● නායකයාගේ සුවිශේෂ චරිත ලක්ෂණ ඉදිරිපත් කරයි.<br>● ඔහුගෙන් ඉටු වූ ජාතික මෙහෙවර අගය කරමින් කතා කරයි. | 02 |
| සාහිත්‍යික, දාර්ශනික විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන පරිශීලනයෙන් ලබාගත් දැනුම විවිධ භාෂා කාර්ය සඳහා යොදා ගනියි. | 10.1 සාහිත්‍යික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි. | ● ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාගේ චරිතය ඇසුරින් ලියැවුණු ලිපියක් (අධ්‍යාපන සියවස ප්‍රකාශන ii කාණ්ඩය) | ● ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර චරිතය හඳුනා ගෙන එම තොරතුරු ඉදිරිපත් කරයි.<br>● කන්නන්ගර මහතාගේ දාර්ශනික අදහස් අගය කරමින් අදහස් දක්වයි.<br>● කන්නන්ගර මැතිතුමාගෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු වූ සේවය විස්තර කරයි. | 03 |
| | 10.2 දැනුම ලබා ගැනීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොත පත කියවයි. | ● පැරණි ගොඩනැගිලි තාක්ෂණය පිළිබඳ ලියවුණු නිර්මාණාත්මක ලේඛනයක්. | ● පුරාණ ලාංකේය ගෘහ නිර්මාණ හඳුනාගෙන නම් කරයි.<br>● පැරණි ගෘහ නිර්මාණ තාක්ෂණය පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරයි.<br>● පැරණි ගොඩනැගිලිවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.<br>● පැරණි ගොඩනැගිලිවල වටිනාකම අගයමින් කතා කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.3 අද්‍යතන සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන සුවිශේෂතා හඳුනා ගෙන බස හසුරුවයි. | ● සාහිත්‍ය විචාරය ගැන ලියවුණු ලිපියක් (ගද්‍ය හා පද්‍ය)<br>● සාහිත්‍ය විචාර සටහන් කේ. ජයතිලක<br>- සදා මෙලෙස පුර දෙරණේ<br>- සුනේත්‍රා<br>- විජයබා කොල්ලය කෘතිවලින් උපුටාගත් කොටස්<br>- කෙකටිය මල් - මහගම සේකර<br>- හිරු මල - පරාක්‍රම කොඩිතුවක්කු | ● අද්‍යතන සාහිත්‍ය නිර්මාණ කියවා ජීවයේ අන්තර්ගතය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.<br>● සාහිත්‍ය නිර්මාණයක අන්තර්ගතයෙන් නිරූපණය වන සුවිශේෂතා විචාරාත්මක ව ඉදිරිපත් කරයි.<br>● සාහිත්‍ය නිර්මාණවල දී විවිධත්වයෙන් යුතු ව භාෂාව භාවිත කිරීම අගය කරමින් කතා කරයි. | 04 |
| 11.0 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි. | 11.1සාහිත්‍ය නිර්මාණ පරිශීලන-යෙන් හඳුනා ගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි | ● හංස සන්දේශය 96 - 104<br>- මයුර සන්දේශය 97 - 104<br>- පරෙවි සන්දේශය 139- 140<br>- සැළලිහිණි සන්දේශය 47 - 50<br>- තොරොක්කෝව කෙටිකතාව අකුතගාවා රියුනුසුකේ පරිවර්තනය - ජයන්ත විමලසේන | ● සාහිත්‍ය නිර්මාණය කියවා ලබන මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.<br>● සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් ලත් ජීවිතාබෝධය පිළිබඳ අදහස් දක්වයි.<br>● මානව අත්දැකීම් සාහිත්‍ය නිර්මාණවලට යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කරයි.<br>● කෙටි කතාව, සන්දේශ කාව්‍ය හා පද්‍ය නිර්මාණ, රසාස්වාදයේ යෙදෙයි. | 03 |
| | 11.2සාහිත්‍ය නිර්මාණ රසාස්වා-දයේ යෙදෙයි. | ● වෙසතුරු දා කව (තෝරා ගත් කවි 10 ක්) | ● පද්‍ය නිර්මාණ ගායනය කරමින් රසවිඳියි.<br>● සාහිත්‍ය නිර්මාණවල අන්තර්ගතය හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>● සාහිත්‍ය නිර්මාණවල කාව්‍යෝපක්‍රම හා ශිල්ප ක්‍රම භාවිත කර ඇති ආකාරය විමර්ශනය කරයි.<br>● රසාස්වාදය සඳහා සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 11.3 සාහිත්‍ය නිර්මාණ අධ්‍යයනය කර විචාර හැකියා ප්‍රදර්ශනය කරයි. | • සාහිත්‍ය නිර්මාණ විචාරය<br>නව කතා කලාව - ජී. බී. සේනානායක | • සාහිත්‍ය නිර්මාණ කියවයි.<br>• සාහිත්‍ය නිර්මාණ පිළිබඳ අදහස් දක්වයි.<br>• විවිධ සාහිත්‍ය නිර්මාණ කියවා විචාරයේ යෙදෙයි.<br>• සාහිත්‍ය රස වින්දනයේ යෙදෙයි. | 04 |
| 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණ කාර්යයේ යෙදෙයි. | 12.1 පද්‍ය නිර්මාණය කරයි. | • පද්‍ය නිර්මාණය කිරීම<br>- සඳැස්/නිසඳැස්<br>- ගී පද රචනා | • නිර්මාණය සඳහා පදනම් වූ අත්දැකීම් ඉදිරිපත් කරයි.<br>• පi නිර්මාණය කිරීමේ දී නිර්මාණාත්මක ව චින්තනය මෙහෙය විය යුතු බව ප්‍රකාශ කරයි.<br>• පද්‍ය නිර්මාණයේ දී යොදාගත හැකි විවිධ කාව්‍යෝපක්‍රම පිළිබඳ ව අදහස් දක්වයි.<br>• පද්‍ය නිර්මාණයේ යෙදෙයි. | 03 |
| | 12.2නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි. | • නිර්මාණාත්මක ප්‍රබන්ධ රචනය (මං තනන්නෝ - මහගමසේකර) කෙටිකතාව වැනි නිර්මාණ ඇසුරින්) | • නිර්මාණකරණය සඳහා වූ අත්දැකීම් ඉදිරිපත් කරයි.<br>• ප්‍රබන්ධ නිර්මාණය කිරීමේ දී නිර්මාණාත්මක ව චින්තනය මෙහෙය විය යුතු බව ප්‍රකාශ කරයි.<br>• ප්‍රබන්ධකරණයේ දී විවිධ රචනෝපක්‍රම භාවිත කිරීම පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.<br>• ප්‍රබන්ධ නිර්මාණකරණයේ යෙදෙයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 12.3 නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි. | • නාට්‍ය පිටපත් නිර්මාණය කිරීම | • උචිත කතා වස්තුවක් හඳුනා ගැනීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• එහි නාට්‍යෝචිත අවස්ථා පැහැදිලි කරයි.<br>• නාට්‍යයට උචිත අයුරින් සිද්ධි සංවිධානය කරයි.<br>• උචිත පරිදි දෙබස් ගොඩ නගමින් චරිත හසුරුවයි.<br>• නාට්‍ය පිටපතක් රචනා කරයි. | 03 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

නිපුණතාව : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම : 1.3 සාහිත්‍ය නිර්මාණවලට සවන් දී රස විඳියි.

කාලච්ඡේද : 03යි.

ඉගෙනුම් පල :

- සාහිත්‍ය නිර්මාණවලට සවන් දී අර්ථ ප්‍රකාශ කරයි.
- සාහිත්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් විස්තර කරයි.
- සාහිත්‍ය නිර්මාණවල භාෂා භාවිතය පිළිබඳ කරුණු දක්වයි.
- නිර්දිෂ්ට ගීත හා පද්‍ය නිර්මාණවලට සවන් දී රස වින්දනයේ යෙදෙයි.
- සාහිත්‍යමය යෙදුම්වල අවස්ථෝචිත බව විමර්ශනය කරයි.
- අදාළ සාහිත්‍ය නිර්මාණය අයත් වන සාහිත්‍ය ක්ෂේත්‍රය හා එහි විශේෂතා ඉදිරිපත් කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- උද්ධෘත පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- පද්‍ය හා ගීත ගායනයට යොමු කර ශ්‍රවණයට අවස්ථාව සලස්වන්න.
- තෝරාගත් සාහිත්‍ය උද්ධෘතවල ධ්වනිතාර්ථය සාකච්ඡා කරන්න.
- නිර්මාණයක් රස විඳීමේ දී අවධානය යොමු කළ යුතු කාව්‍යමය ලක්ෂණ සාකච්ඡා කරන්න.
- අදාළ නිර්මාණ අර්ථ විග්‍රහ කරමින් රසාස්වාදයට යොමු කරන්න.

මූලික වදන් හා සංකල්ප : උද්ධෘතය : මූලාශ්‍ර ග්‍රන්ථයකින් උපුටාගත් කොටස

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සාහිත්‍ය විද්‍යාව - එදිරිවීර සරච්චන්ද්‍ර
  (ලය, වෘත්තය, තාලය හා රිද්මය යන ලක්ෂණ විචාරය කෙරෙන කොටස)
  සාහිත්‍යය විචාර සටහන් - කේ. ජයතිලක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සාහිත්‍ය නිර්මාණවලට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.
- සාහිත්‍ය නිර්මාණවලින් ධ්වනිත වන අදහස් අගය කරයි.
- කාව්‍යමය ලක්ෂණ ඉස්මතු කර දක්වයි.
- කාව්‍යය නිර්මාණ රසවත් වීමට හේතු වූ කරුණු පැහැදිලි කරයි.
- සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.

නිපුණතාව : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා හා කථන කුසලතා ඵලදායි ලෙස යොද ගනියි.

නිපුණතා මට්ටම : 1.4 සාවධාන ව සවන් දී තොරතුරු රැස් කරයි.

කාලච්ඡේද : 3යි.

ඉගෙනුම් පල :

- අවධානයෙන් යුතු ව සවන් දීමෙන් අවශ්‍ය තොරතුරු එක්රැස් කරයි.
- රැස් කර ගත් තොරතුරු අවස්ථෝචිත ව යොදා ගනියි.
- සවන් දී තොරතුරු රැස් කිරීම අගය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සජීවී සාකච්ඡාවක් ශ්‍රවණය කිරීමට බොහෝ විට ලැබෙනුයේ එක් අවස්ථාවක් පමණක් නිසා එම අවස්ථාවේ ඇති වැදගත්කම පැහැදිලි කරන්න.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහනකට අවධානයෙන් යුතු ව සවන් දී තොරතුරු ගවේෂණයට යොමු කර අවශ්‍ය තොරතුරු සටහන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- විද්‍යුත් මාධ්‍ය වැඩසටහනකට සවන් දීමට අවස්ථාව ලබා දෙන්න.
- සවන් දුන් විද්‍යුත් මාධ්‍ය වැඩ සටහනට අදාළ ව ප්‍රශ්න නගමින් එම තොරතුරු ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- විද්‍යුත් මාධ්‍යය - ගුවන්විදුලි, රූපවාහිනී ආදි මාධ්‍ය

ගුණාත්මක යෙදවුම් :

- ගුවන්විදුලියෙන් ප්‍රචාරය වූ විද්වත් දේශනයක්/සාකච්ඡාවක්

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- විද්‍යුත් මාධ්‍ය වැඩසටහන්වලට සවන් දී තොරතුරු ඉදිරිපත් කරයි.
- විද්‍යුත් මාධ්‍යවලට සවන්දීම අගය කරයි.
- රැස් කරගත් තොරතුරු අවස්ථෝචිත ව භාවිත කරයි.
- තොරතුරු ගවේෂණය සඳහා විද්‍යුත් මාධ්‍ය වැඩ සටහන්වලට සවන්දීමේ පරිචය ප්‍රදර්ශනය කරයි.

නිපුණතාව : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම : 1.5 දේශන, සාකච්ඡා ආදියට විචාරශීලී ව සවන් දීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

කාලච්ඡේද : 3යි.

ඉගෙනුම් පල :

- දේශන, සාකච්ඡා ආදියට සහභාගිවීමේ කැමැත්ත ප්‍රකාශ කරයි.
- දේශන සාකච්ඡා ආදියට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.
- විචාරාත්මක ව තම අදහස් ප්‍රකාශ කරයි.
- දේශන සාකච්ඡාවල ඇතුළත් වැදගත් කරුණු ඉදිරිපත් කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- එදිනෙදා ජීවිතයේ දී අසන්නට ලැබෙන දේශන, සාකච්ඡා ආදියට සහභාගිවීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- දේශන සාකච්ඡා ආදියට සහභාගිවී ඒවාට විචාරශීලී ව සවන් දීමේ වැදගත්කම පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබා දෙන්න.
- දේශනයකට/සාකච්ඡාවකට සවන් දීමෙන් රැස්කරගත් තොරතුරු ඉදිරිපත් කිරීමට අවස්ථා ලබා දෙන්න.

මූලික වදන් හා සංකල්ප :

විචාරශීලීබව :

- යම් කරුණක් පිළිබඳ ව හොඳින් විමර්ශනය කිරීමේ හැකියාවෙන් යුක්ත වීම.

ගුණාත්මක යෙදවුම් :

- දේශනයක් හා සාකච්ඡාවක්

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- දේශන හා සාකච්ඡාවලට සවන් දීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- දේශන සාකච්ඡාවලින් මතුවන කරුණු පිළිබඳ විචාරශීලී ව අදහස් ප්‍රකාශ කරයි.
- දේශන සාකච්ඡා ආදියට සහභාගි වෙයි.
- දේශන, සාකච්ඡා ආදියෙන් ඉදිරිපත් කරන කරුණු අගය කරයි.

නිපුණතාව : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ කුසලතා හා කථන කුසලතා ඵලදායි ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම : 1.6 නිරවුල් ව හා නිවැරදි ලෙස බස හසුරුවමින් හඬ පාලනයෙන් යුතු ව කතා කරයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- සාර්ථක කතාවක තිබිය යුතු ලක්ෂණ ඉදිරිපත් කරයි.
- සබකෝලයෙන් තොර ව කතා කරයි.
- නිවැරදි ව හා පැහැදිලි ව අදහස් ඉදිරිපත් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කරයි.
- නිවැරදි උච්චාරණය හා උචිත අංග චලන භාවිත කරමින් කතා කරයි.
- සෙසු අයගේ අවධානය යොමු කර ගනිමින් කතා කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- කතාවක තිබිය යුතු මූලික ලක්ෂණ පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- හඬ පටයක් මගින් හෝ වෙනත් ක්‍රමවේදයක් මගින් කතාවකට සවන් දීමට සලස්වන්න.
- මෙම කතාව ශිෂ්‍යයකු මගින් ආදර්ශනය කරන්න.
- එම කතාවේ දී දක්නට ලැබුණ සුවිශේෂ ලක්ෂණ ඉස්මතු කර දක්වන්න.
- සියලු ම ශිෂ්‍යයන්ට කතාවක් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාව සලසා දෙන්න.
- ශිෂ්‍යයන් ඉදිරිපත් කරන කතා පිළිබඳ ව එම අවස්ථාවේ දී ම ඇගයීමක් කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- සබකෝලය - පිරිසක් ඉදිරියේ පෙනී සිටිමින් කතා කිරීමට ඇති බිය/චකිතය
- තර්කානුකූල ව - හේතුඵල සම්බන්ධතාව තහවුරු වන පරිදි
- ආදර්ශනය - සිදු වන ආකාරය අනුකරණය කර පෙන්වීම

ගුණාත්මක යෙදවුම් :

- ආරාධිතයකුගේ දේශනයක්

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සාර්ථක කතාවක තිබිය යුතු ලක්ෂණ ඉදිරිපත් කරයි.
- සබකෝලයෙන් තොරව කතාවක් ඉදිරිපත් කිරීමේ හැකියාව අගය කරයි.
- තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- ශ්‍රාවකයන්ගේ ආකර්ෂණය දිනා ගනිමින් කතා කරයි.

නිපුණතාව : 1.0 සන්නිවේදනය සාර්ථක කර ගැනීම සඳහා ශ්‍රවණ හා කථන කුසලතා ඵලදායී ලෙස යොදා ගනියි.

නිපුණතා මට්ටම : 1.7 බහු විධ මාධ්‍ය යොදා ගනිමින් ඉදිරිපත් කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- ඉදිරිපත් කිරීම් සඳහා යොදාගත හැකි විවිධ මාධ්‍ය පැහැදිලි කරයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් ඉදිරිපත් කිරීමේ හැකියාව අගය කරයි.
- බහු විධ මාධ්‍ය භාවිත කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.
- තාක්ෂණික මෙවලම් භාවිත කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ඉදිරිපත් කිරීම් සඳහා ලැබෙන අවස්ථා හඳුන්වා දෙන්න.
- ඉදිරිපත් කිරීමේ දී කථනය සමග පත්‍රිකා, ඡායාරූප, චිත්‍ර සටහන් වගු, ප්‍රස්තාර, හඬ පට, දර්ශන ආදි මාධ්‍ය කිහිපයක් එකවර යොදා ගනිමින් පැහැදිලි කිරීම බහු මාධ්‍ය භාවිතය බව පැහැදිලි කරන්න.
- කරුණු පැහැදිලි කිරීමට සහ තහවුරු කිරීමට බහුමාධ්‍ය යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.
- ඉදිරිපත් කරන කරුණුවල නිරවද්‍යතාව කෙරෙහි මෙහිදී වඩා සැලකිලිමත් විය යුතු බව පෙන්වා දෙන්න.
- ඒවා සරල ව හා පැහැදිලි ව තේරුම් ගත හැකි පරිදි සකස් කළ යුතු බව පෙන්වා දෙන්න.
- ඉදිරිපත් කිරීම් සඳහා උචිත පරිදි තාක්ෂණය භාවිත කිරීමේ හැකියාව පැහැදිලි කරන්න.
- මාධ්‍ය කිහිපයක් යොදා ගනිමින් කිසියම් ඉදිරිපත් කිරීමක් සඳහා සිසුන් යොමු කරන්න.

මූලික වදන් හා සංකල්ප : බහුමාධ්‍ය - ඉදිරිපත් කිරීම් සඳහා කථනය සමග යොදාගත හැකි ඡායාරූප චිත්‍ර, වගු ප්‍රස්තාර පත්‍රිකා, ශ්‍රව්‍ය, දෘශ්‍ය !මාසදල ඪ්‍යාසද* ආධාරක ආදිය.

තාක්ෂණික මෙවලම් : උහිස් ප්‍රක්ෂේප, බහු මාධ්‍ය ප්‍රක්ෂේපය, පරිගණකය ආදිය.

ගුණාත්මක යෙදවුම් :

- උහිස් ප්‍රක්ෂේපණ යන්ත්‍ර - ධඩැර ඎ ඡරදවැජඑදරි
- බහුවිධ ප්‍රක්ෂේපණ යන්ත්‍ර - ඵමකඑස ඪ්‍යාස් ඡරදවැජඑදරි
- ප්‍රදර්ශන පුවරු - හදඑසජැ ඊද්රා
- පිටු පෙරළන - ඎකසච ඤ්රචී
- සැණපත් - ඎකීය ඤ්රී

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ

- බහුමාධ්‍ය යනු කුමක්දැයි පැහැදිලි කරයි.
- ඉදිරිපත් කිරීම්වල දී බහු මාධ්‍ය යොදා ගැනීම අගය කරයි.
- නිරවුල් ව  පැහැදිලිව අදහස් ඉදිරිපත් කරයි.
- තාක්ෂණික මෙවලම් භාවිත කරමින් කිසියම් ඉදිරිපත් කිරීමක් සාර්ථක ව සිදු කරයි.

නිපුණතාව : 2.0 ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි.

නිපුණතා මට්ටම : 2.2 විවිධ ශෛලියෙන් රචිත පොත පත කියවයි.

කාලච්ඡේද : 04යි

ඉගෙනුම් පල :

- පොත පත කියවීමේ දී ශෛලීය විවිධතා හඳුනා ගෙන කියවයි.
- අසන්නාට ප්‍රිය උපදවන පරිදි පැරණි සාහිත්‍ය නිර්මාණ කියවයි.
- නිවැරදි ශබ්ද උච්චාරණය කෙරෙහි අවධානය යොමු කරමින් හඬ නගා කියවයි.
- අසන්නන්ගේ අවධානය දිනා ගනිමින් පොත පත කියවයි.
- පොත පත කියවා එහි විවිධ ශෛලි අගය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- විවිධ ලේඛන ශෛලිවලින් පොතපත ලියා ඇති බව පෙන්වා දෙන්න.
- එක ම කරුණ විවිධ කතුවරු විවිධාකාරයෙන් ලියා ඇති ආකාරය පැහැදිලි කර දෙන්න.
- උධෘතයට අදාළ ශෛලිය අනුගමනය කරමින්, නිවැරදි උච්චාරණයෙන් යුතු ව, විරාම ලක්ෂණ කෙරෙහි අනුගත වෙමින් අර්ථාවබෝධයෙන්, කියවීමට සිසුන් යොමු කරන්න.

මූලික වදන් හා සංකල්ප :

ශෛලිය :

ප්‍රකාශන විලාසයයි. ශෛලිය කථනයට මෙන් ම ලේඛනයට ද අදාළ වේ. කථනයේ දී හෝ ලේඛනයේ දී හෝ කථකයා හෝ ලේඛකයා හෝ විසින් භාවිත කරනු ලබන වාං මාලාව, වාගාලංකාර ආදිය ශෛලියට අයත් වේ.

ගුණාත්මක යෙදවුම් :

- අමාවතුර, බුත්සරණ, පූජාවලිය ග්‍රන්ථවල ඇතුළත් නාලාගිරි දමනය කතාව
- ශ්‍රැති ගෝචර ශෛලියෙන් කියවන ලද සම්භාව්‍ය සාහිත්‍ය නිර්මාණයක කොටසක්

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- පොතපත කියවීමේ දී ශෛලීය විවිධතා හඳුනාගෙන කියවයි.
- ශෛලීය විවිධතා හඳුනාගෙන කියවීමේ හැකියාව අගය කරයි.
- නිවැරදි ව හා නිරවුල් ව ශබ්ද උච්චාරණය කරමින් කියවයි.
- අන් අයගේ අවධානය දිනා ගනිමින් ශබ්ද නඟා කියවයි.

| | | | |
|---|---|---|---|
| නිපුණතාව | : | 2.0 | ජීවන අත්දැකීම් පුළුල් කර ගැනීම සඳහා කියවීමේ පුරුදු අර්ථවත් ව යොදා ගනියි. |
| නිපුණතා මට්ටම | : | 2.3 | නිශ්ශබ්දව කියවා අවබෝධ කරගත් කරුණු ඉදිරිපත් කරයි. |
| කාලච්ඡේද | : | 04යි. | |
| ඉගෙනුම් පල | : | | |

- විවිධ විෂයන්ට අදාළ ලේඛන කියවීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- විවිධ ලේඛන කියවීමෙන් අවබෝධ කර ගත් කරුණු ඉදිරිපත් කරයි.
- පොත පත කියවීමෙන් පුළුල් කර ගත් වාක් කෝෂය භාෂා කාර්යයේ දී භාවිත කරයි.
- නිශ්ශබ්ද ව පොත පත කියවීම අගය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- තොරතුරු හා දැනුම ලබා ගැනීම සඳහා නිශ්ශබ්ද ව කියවීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
- වැදගත් තොරතුරු දැන ගැනීම සඳහා තම රුචිකත්වය අනුව පොතපත කියවීමට හුරුවීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
- අමතර දැනුම ලබා ගැනීමට පොතපත කියවීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න.
- විවිධ විෂය යටතේ පොතපත කියවීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- ශාස්ත්‍රීය පොතපත කියවීමෙන් දැනුම වර්ධනය සඳහා තොරතුරු රැස් කර ගැනීමට යොමු කරන්න.
- තමා කැමති විෂය ක්ෂේත්‍රයක් තෝරා ගෙන එම විෂය ක්ෂේත්‍රය පිළිබඳ ව වැඩියෙන් කියවීමට යොමු කරන්න.

මූලික වදන් හා සංකල්පඃ

- වාක් කෝෂය : වචන ගොනුව
- ව්‍යක්ත : උගත් බව

ගුණාත්මක යෙදවුම් :

- සේනක බිබිලේ මහතාගේ ඡායාරූපයක්
- පෙළ පොතෙහි එන සේනක බිබිලේ චරිත කතාව ඇතුළත් පාඩම
- පූජිත ජීවිත - (චරිත කතා වෙළුම සල ධ)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- විවිධ විෂය ක්ෂේත්‍රවලට අයත් පොත පත කියවයි.
- විවිධ පොතපත කියවා තොරතුරු රැස් කිරීම අගය කරයි.
- කියවීමෙන් ලබාගත් තොරතුරු පදනම් කර ගෙන භාෂා කාර්යයන් හි නිරත වේ.
- ව්‍යක්ත ලෙස අදහස් ඉදිරිපත් කරයි.

නිපුණතාව : 3.0 සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 3.1 සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන විවිධ ප්‍රභේද යටතේ වර්ග කරයි.

කාලච්ඡේද : 3යි.

ඉගෙනුම් පල :

- සිංහල අක්ෂරමාලාව නිවැරදි ව අනුපිළිවෙළින් ඉදිරිපත් කරයි.
- ඝෝෂ, අඝෝෂ භේදය හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- අන්තස්ථාක්ෂර හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- අනුස්වාරය හා විසර්ගය හඳුනාගෙන නිවැරදි ව භාවිත කරයි.
- ඌෂ්මාක්ෂර හඳුනාගෙන භාෂා කාර්යයේ දී නිවැරදි ව යොදා ගනියි.
- භාෂා කාර්යයේ දී 'ෆ' අක්ෂරය නිවැරදි ව යොදා ගනියි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- නූතන සිංහල අක්ෂරමාලාව පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ පෙර දැනුම හා මතකය විමසා බලන්න.
- අන්තස්ථාක්ෂර හඳුන්වා දෙන්න.
- අනුස්වාරය හා විසර්ගය හඳුන්වා දී උදාහරණ මගින් ඒවා භාෂාවේ යෙදෙන අවස්ථා පිළිබඳ ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කරන්න.
- ඌෂ්මාක්ෂර හා 'ෆ' අක්ෂරය හඳුනා ගැනීමට අවස්ථාව දෙන්න.
- ඌෂ්මාක්ෂර උච්චාරණය කිරීමට අවස්ථාව සලසා දී පරීක්ෂා කරන්න.
- ලේඛනයේ දී සිංහල අක්ෂර නිවැරදි ව භාවිත කිරීමට යොමු කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- අන්ථස්තාක්ෂර : ය් ර් ල් ව් යන අක්ෂර පිළිවෙළින් ඉ ඍ ඏ උ යන ස්වරවලට සමාන ව උච්චාරණය වන නිසා ස්වර සහ ව්‍යඤ්ජන ලක්ෂණ අවයව දක්වන අක්ෂර
- ඌෂ්මාක්ෂර : ශ, ෂ, ස, හ අක්ෂර උච්චාරණය කිරීමේ දී උෂ්ණ වායුධාරාවක් නිකුත් කරමින් උච්චාරණය වන ශබ්ද සඳහා වූ අක්ෂර

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ හා ශිෂ්‍යයාගේ පරිහරණය සඳහා

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- වර්ග අනුව බෙදා දක්වා ඇති සිංහල අක්ෂරමාලාව සහිත ප්‍රදර්ශන පුවරුවක්

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සිංහල අක්ෂරමාලාව අනුපිළිවෙළින් ඉදිරිපත් කරයි.
- සිංහල අක්ෂරමාලාව නිවැරදි ව වර්ග කරයි.
- සිංහල අක්ෂරමාලාව පිළිබඳ අවබෝධයෙන් යුතු ව භාෂාව භාවිත කරයි.
- සිංහල අක්ෂරමාලාව නිවැරදි ව දැන ගැනීම අගය කරයි.

| | | | |
|---|---|---|---|
| නිපුණතාව | : | 3.0 | සිංහල අක්ෂරමාලාව හඳුනාගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි. |
| නිපුණතා මට්ටම | : | 3.2 | ප්‍රායෝගික භාෂා කාර්ය මැනවින් ඉටු කර ගැනීම සඳහා සිංහල අකාරාදි පිළිවෙළ භාවිත කරයි. |
| කාලච්ඡේද | : | 02යි. | |
| ඉගෙනුම් පල | : | | |

- අකාරාදි පිළිවෙළ මතකයෙන් ලියයි.
- වචනාර්ථ, අක්ෂර වින්‍යාසය පරීක්ෂා කිරීම සඳහා ශබ්දකෝෂ භාවිත කරයි.
- ශබ්දකෝෂ පහසුවෙන් පරිහරණය කරයි.
- අකාරාදි පිළිවෙළට අනුව වචන පෙළ ගස්වයි.
- ශබ්දකෝෂ පරිහරණය අගය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සුදුසු ක්‍රමවේදයක් මගින් අකාරාදි පිළිවෙළ පිළිබඳ සිසුන්ගේ පෙර දැනුම පරීක්ෂා කරන්න.
- සුදුසු ශබ්දකෝෂයක් භාවිත කර වචන කිහිපයක අර්ථය සෙවීමට යොමු කරන්න.
- ශබ්දකෝෂ භාවිතයේ දී අකාරාදි පිළිවෙළ දැන ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- වචන කීපයක් උදාරණයට ගෙන නිවැරදි අක්ෂර වින්‍යාසය දැන ගැනීම සඳහා ශබ්ද කෝෂ භාවිතයට යොමු කරන්න.
- වචනාර්ථ සොයා ගැනීම සඳහා ශබ්ද කෝෂ භාවිතයේ වැදගත්කම අවධාරණය කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- අකාරාදිය : අක්ෂරමාලාවේ අනුපිළිවෙළ දැක්වීම.
- අක්ෂර වින්‍යාසය : භාෂාවක ලේඛන ව්‍යවහාරයක දී නිවැරදි ව අක්ෂර භාවිතය

ගුණාත්මක යෙදවුම් :

- ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය
- මහා සිංහල ශබ්ද කෝෂය - හරිස්චන්ද්‍ර විජේතුංග

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සිංහල අක්ෂරමාලාවේ අකාරාදි පිළිවෙළ පැහැදිලි කරයි.
- ශබ්දකෝෂ නිවැරදි ව භාවිත කිරීමේ හැකියාව අගය කරයි.
- අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
- නාම ලේඛන අකාරාදි පිළිවෙළට පිළියෙල කරයි.

නිපුණතාව : 3.0 සිංහල අක්ෂරමාලාව හඳුනා ගෙන ලේඛනයේ දී නිවැරදි ව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 3.3 නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි.

කාලච්ඡේද : 2යි.

ඉගෙනුම් පල :

- අක්ෂර වින්‍යාසය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලියයි.
- ලේඛනයේ දී අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම අවශ්‍ය බව ප්‍රකාශ කරයි.
- අක්ෂර වින්‍යාසය අනුව වචනයක අර්ථ වෙනස් වන ආකාරය පැහැදිලි කරයි.
- ලේඛනවල අක්ෂර වින්‍යාසය නිවැරදි කරයි.
- අක්ෂර වින්‍යාසය නිවැරදි ව භාවිත කිරීම අගය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- අක්ෂර වින්‍යාසය පිළිබඳ ශිෂ්‍යයන්ගේ පෙර දැනුම විමසා බලන්න.
- නිවැරදි ව ලිවීමේ අවශ්‍යතාව පිළිබඳ ව ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- ණ, න, ළ, ල, ශ, ෂ, ස අක්ෂර වින්‍යාස රීති නැවත සාකච්ඡා කරන්න.
- මහාප්‍රාණ අක්ෂර භාවිතය පිළිබඳ සාකච්ඡා කරන්න.
- සඤ්ඤක අක්ෂර යෙදුණු වචන උදාහරණ දක්වමින් ඉදිරිපත් කරන්න.
- අක්ෂර වින්‍යාසය හා සම්බන්ධ අභ්‍යාසවල යොදවන්න.
- අක්ෂර වින්‍යාසය පිළිබඳ තම දැනුම අනුසාරයෙන් ලේඛන කීපයක් සපයා ඒවා නිවැරදි කර ගැනීමට යොමු කරවන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහලයේ අක්ෂර වින්‍යාසය අත්පොත - ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- සිංහල අකාරාදි පිළිවෙළ - සඳගෝමී කෝපරහේවා

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- අක්ෂර වින්‍යාසය පිළිබඳ නිවැරදි දැනුම ප්‍රදර්ශනය කරයි.
- නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ව ලියයි.
- ලේඛනවල අක්ෂර වින්‍යාස දෝෂ නිවැරදි කරයි.
- නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු ලේඛන අගය කරයි.

නිපුණතාව : 4.0 ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 4.1 විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි.

කාලච්ඡේද : 03යි.

ඉගෙනුම් පල :

- විරාම ලකුණු නිවැරදි ව හඳුනාගෙන නම් කරයි.
- ලේඛනයේ දී විරාම ලකුණු අර්ථවත් ව භාවිත කරයි.
- නිවැරදි ව විරාම ලකුණු භාවිතය අගය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- විරාම ලක්ෂණ හඳුනා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- විරාම ලක්ෂණ භාවිත කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- ලිවීමේ දී විරාම ලක්ෂණ යෙදීමට හුරු කරවන්න.
- ලේඛනයක් ඉදිරිපත් කර විරාම ලක්ෂණ යෙදීමේ අභ්‍යාසයක නිරත කරවන්න.
- ලේඛනයේ දී නිවැරදි ව හා අර්ථවත් ව විරාම ලක්ෂණ භාවිත කිරීමට හුරු කරවන්න.

මූලික වදන් හා සංකල්ප :

- ශිල්පීය ප්‍රයෝග :
  ලේඛනයේ දී යොදා ගනු ලබන අක්ෂර වින්‍යාසය, විරාම ලකුණු, පද බෙදීම, ඡේද බෙදීම වැනි උපක්‍රම
- විරාම ලකුණු :
  ලේඛනයේ දී අදහස් හා කරුණු නිවැරදි ව විරාමයක් දැක්වීම ඉදිරිපත් කිරීම සඳහා යොදාගනු ලබන සංකේත

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- විරාම ලක්ෂණ දක්වා ඇති පුවරුවක්.
- නිවැරදි ව විරාම ලක්ෂණ යොදා ලියන ලද ලේඛනයක්.
- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- විරාම ලකුණු හඳුනා ගෙන නම් කරයි.
- විරාම ලකුණු නිවැරදි ව භාවිත කරමින් ලියයි.
- විරාම ලකුණු පිළිබඳ දැනුම භාවිත කරමින් ලේඛන නිවැරදි කරයි.
- ලේඛනයේ දී නිවැරදි ව විරාම ලකුණු භාවිතය අගය කරයි.

නිපුණතාව : 04 ශිල්පීය ප්‍රයෝග ඉස්මතු කරමින් නිවැරදි ව ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 4.2 පද බෙදීමේ රීති අනුගමනය කරමින් ලියයි.

කාලච්ඡේද : 02යි.

ඉගෙනුම් පල :

- . පදය . යන ව්‍යාකරණමය ඒකකය හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- වාක්‍යයක පද, ස්ථාන ගත කළ යුතු ශෛලි හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- උපකාරක ක්‍රියා පද වෙන් කොට හෝ එක්කොට හෝ ලිවීම පිළිගනී.
- . දී . නිපාතය වෙන්කොට ලියයි.

පාඩම සැලසුම කිරීම සඳහා උපදෙස් :

- පද බෙදා ලිවීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
- සම්මතයට අනුව පද බෙදීම කළ යුතු ආකාරය පෙන්වා දෙන්න.
- එකින් එක වෙන් කොට ලිවිය යුතු පද වර්ග හඳුන්වා දෙන්න.
- පූර්ව හෝ අපර පදයට එක්කර ලිවිය යුතු පද වර්ග පෙන්වා දෙන්න.
- දම, පිය, ලා, ගන් යන උපකාරක පද එක් ව හෝ වෙන් ව හෝ ලිවිය හැකි බව උදාහරණ සහිත ව පෙන්වා දෙන්න.
- "දී" නිපාතය වෙන් කොට ලිවිය යුතු බව උදාහරන සහිත ව පෙන්වා දෙන්න.
- විකල්ප වශයෙන් එක්කොට හෝ වෙන්කොට භාවිත කළ හැකි පද වර්ග හා ඒවා සමරූපතාවෙන් යුතු ව යොදන ආකාරය පෙන්වා දෙන්න.
- විකල්ප භාවිත සහිත විවිධ පද බෙදීමේ ශෛලි ඇති බව පැහැදිලි කරන්න.
- පද වර්ග හඳුනා ගෙන ලිවිය යුතු බව පෙන්වා දෙන්න.
- වෙන් කර ලිවිය යුතු පද පිළිබඳ අවබෝධය පරීක්ෂා කරන්න.
- ලේඛන ඉදිරිපත් කර පද බෙදීමේ අභ්‍යාසයක ශිෂ්‍යයන් නිරත කරවන්න.

මූලික වදන් හා සංකල්ප :

- සම්මතය : බොහෝ දෙනෙකුගේ එකඟතාවකින් යුතු ව භාවිතය
- සමරූපතාව : එක සමාන ආකරයෙන් යුක්ත බව.

ගුණාත්මක යෙදවුම් :

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල රචනය හා සාහිත්‍යය රසාස්වාදය - වී තේනබදු

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- පද වර්ග හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- එකතු කර ලිවිය යුතු හා වෙන් කර ලිවිය යුතු පද හඳුනාගෙන ලියයි.
- පද බෙදා ලිවීමේ රීති හා ශෛලි අනුගමනය කරයි.
- නිවැරදි ව පද බෙදා ලිවීමේ හැකියාව අගය කරයි.

නිපුණතාව : 5.0 භාෂාමය කාර්යයේ දී වාක් කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 5.1 වාක්කෝෂීය දැනුම ප්‍රදර්ශනය කරයි.

කාලච්ඡේද : 02යි.

ඉගෙනුම් පල :

- විවිධ ලිපි ලේඛන කියවා වාක්කෝෂීය විවිධතා ඉදිරිපත් කරයි.
- වචනවල අර්ථය අදාළ අවස්ථාව හා සිද්ධිය සම්බන්ධ වන බව ප්‍රකාශ කරයි.
- භාෂා භාවිතයේ දී එම වචන අර්ථවත් ව යොදයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- විවිධ විෂය ක්ෂේත්‍ර යටතේ ලියවුණු පොතපත කියවීමට සලස්වන්න.
- පාරිභාෂික වචන හඳුනාගෙන රැස් කිරීමට උපදෙස් දෙන්න.
- එම වචනවල අර්ථය නිවැරදි හඳුනාගැනීමට උපකාර කරන්න.
- එම වචන වාක්‍යවල යොදමින් ඒවා නිවැරදි ව හඳුනා ගැනීම සඳහා අභ්‍යාසයක නිරත කරවන්න.
- එම අභ්‍යාසය මගින් නිවැරදි ව භාෂාව භාවිත කිරීමට හුරු කරවන්න.

ගුණාත්මක යෙදවුම් :

- මහා සිංහල ශබ්ද කෝෂය - හරිස්චන්ද්‍ර විජේතුංග

ඇගයීම තක්සේරුකරණය සඳහා උපදෙස් :

- වාක්කෝෂයේ විවිධතා හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- යෙදෙන අවස්ථාව අනුව අර්ථ වටහා ගෙන භාවිත කරයි.
- විවිධ භාෂා කාර්යයයේ දී වාක්කෝෂය අර්ථවත් ව භාවිත කරයි.
- වාක්කෝෂය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
- වාක්කෝෂය පිළිබඳ දැනුම අගය කරයි.

නිපුණතාව : 5.0 භාෂාමය කාර්යයේ දී වාක්කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 5.2 සාම්ප්‍රදායික යෙදුම් භාෂාමය කාර්යයේ දී උචිත පරිදි භාවිත කරයි.

කාලච්ඡේද : 03යි.

ඉගෙනුම් පල :

- ප්‍රස්තාව පිරුළු, රූඪී, යුගල පද, ආප්තෝපදේශ ආදි සාම්ප්‍රදායික යෙදුම් හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරමින් රසවත් ව අදහස් ප්‍රකාශ කරයි.
- ලේඛනයේ දී සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- භාෂාවේ යෙදෙන සාම්ප්‍රදායික යෙදුම් හඳුන්වා දෙන්න.
- සාම්ප්‍රදායික යෙදුම් අර්ථවත් ව භාවිත වන අවස්ථා විවිධ නිර්මාණ ඇසුරින් පහදා දෙන්න.
- එවැනි යෙදුම් ඇතුළත් කර වාක්‍ය නිර්මාණයට යොමු කරන්න.
- අදහස් ප්‍රකාශ කිරීමේ දී සාම්ප්‍රදායික යෙදුම් අවස්ථෝචිත ව භාවිත කිරීමට උපදෙස් දෙන්න.
- මේ සඳහා ශිෂ්‍යයන් අභ්‍යාසයක නිරත කරවන්න.

මූලික වදන් හා සංකල්ප :

- ප්‍රස්තාව පිරුළු : අවස්ථෝචිත ව කළ ප්‍රකාශය
- රූඪී : වාච්‍යාර්ථය අභිබවමින් අදහස් ප්‍රකාශ වන යෙදුම්
- යුගල පද : ශබ්දාර්ථය කෙරෙහි අවධානය යොමු කෙරෙන පරිදි සමීපයේ යෙදෙමින් අර්ථ ප්‍රකාශිත වචන යුගල
- ආප්තෝපදේශ: ජීවිතයට වැදගත් උපදෙස් ප්‍රකාශ කරන කියමන්

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- පිරුළු මිණි - ටී. එස්. ධර්මබන්ධු
- සිංහල ප්‍රස්තා පිරුළු සාහිත්‍යය - ප්‍රේමදාස අලවත්තගේ

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සාම්ප්‍රදායික යෙදුම් හඳුනාගෙන නම් කරයි.
- සාම්ප්‍රදායික යෙදුම් භාවිතය අගය කරයි.
- රසවත් ව අදහස් ඉදිරිපත් කිරීම සඳහා සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි.
- උචිත පරිදි සාම්ප්‍රදායික යෙදුම් භාවිත කරයි.

නිපුණතාව : 5.0 භාෂාමය කාර්යයේ දී වාක් කෝෂය, භාෂා සම්ප්‍රදාය හා භාෂා ව්‍යවහාර පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම : 5.3 භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනාගෙන භාෂාව භාවිත කරයි.

කාලච්ඡේද : 2යි.

ඉගෙනුම් පල :

- සමාජයක භාෂා ව්‍යවහාරයේ ප්‍රභේද පවත්නා බව ප්‍රකාශ කරයි.
- භාෂා ව්‍යවහාරවල ප්‍රභේද, අදාළ සමාජ කණ්ඩායම්වල අනන්‍යතාව පළ කරන බව ප්‍රකාශ කරයි.
- විවිධ භාෂා ව්‍යවහාර භාවිත කරන සමාජ කණ්ඩායම් ඇති බව ප්‍රකාශ කරයි.
- විවිධ වෘත්තීන් හා බැඳුණු භාෂා ව්‍යවහාර ඇති බව ප්‍රකාශ කරයි.
- හඳුනාගත් වචන ඇසුරෙන් සන්නිවේදනයේ යෙදෙයි.
- විවිධ භාෂා ව්‍යවහාර අගය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පළාත් හා අවස්ථාව අනුව භාෂාවේ විවිධතා ඇති බව පෙන්වා දෙන්න.
- ඌව පළාත, දකුණු පළාත, ආදී වශයෙන් පළාත් අනුව භාෂාවේ විවිධතා ඇති බව නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.
- කමතේ දී, ධීවර කර්මාන්තයේ දී හේන් ගොවිතැන වැනි ජීවන වෘත්තිය හා බැඳුණු භාෂා ව්‍යවහාර ඇති බව පෙන්වා දෙන්න.
- විහාරස්ථානය, දේවාලය වැනි ආගමික ස්ථානවල දී විශේෂ භාෂා ව්‍යවහාර දක්නට ලැබෙන බව නිදසුන් මගින් පැහැදිලි කරන්න.

මූලික වදන් :

- ව්‍යවහාර ප්‍රභේද - එකම භාෂාවෙහි දක්නට ලැබෙන විවිධ භාෂා ව්‍යවහාර

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- භාෂාව හා සමාජය - කේ. එන්. ඕ. ධර්මදාස
- ජනවහර - ජේ. බී. දිසානායක

ඇගයීම තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ප්‍රධාන භාෂාවේ ව්‍යවහාර ප්‍රභේද ඇති බව ප්‍රකාශ කරයි.
- භාෂා ව්‍යවහාර හඳුනාගෙන භාෂාව භාවිත කිරීම අගය කරයි.
- විවිධ සංස්කෘතික කණ්ඩායම් අනුව භාෂා විවිධතා ඇති බව ප්‍රකාශ කරයි.
- භාෂා ව්‍යවහාරයේ විවිධතා හඳුනාගෙන සන්නිවේදනයේ යෙදෙයි.
- ලේඛනයේ දී හා කථනයේ දී භාෂා ව්‍යවහාර භාවිත කරයි.

නිපුණතාව : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 6.1 නාම පද සහ එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- නාම පදවල ප්‍රකෘති හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- ප්‍රකෘති භාවිත කරමින් නාම පද සකස් කරයි.
- නාම ප්‍රකෘති, භාෂාවේ යෙදෙන අවස්ථා පැහැදිලි කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- නාම පදය හඳුන්වා ඊට අදාළ ප්‍රකෘතිය හඳුන්වා දෙන්න.
- නාම පදයක ප්‍රකෘතිය හඳුනා ගැනීමේ ලක්ෂණ පෙන්වා දෙන්න.
- භාෂාවෙහි ප්‍රකෘතිය යෙදෙන අවස්ථා නිදසුන් මගින් පෙන්වා දෙන්න.
- නාම පද කිහිපයක් ඉදිරිපත් කර අදාළ ප්‍රකෘති මතු කර ගැනීමට අවස්ථාව දෙන්න.

මූලික වදන් හා සංකල්ප :

- සම්මත භාෂා රීති : පොදුවේ පිළිගෙන අනුගමනය කරන භාෂා නියමයන්
- ප්‍රකෘති : මුල් ස්වරූපය (නාම පදයක, ක්‍රියා පදයක)

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්. එස්. කරුණාතිලක
- ප්‍රකෘති - ජේ. බී. දිසානායක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නාම පදවල ප්‍රකෘති හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- පද සකස් කිරීමේ දී ප්‍රකෘති කෙරෙහි අවධානය යොමු කිරීම අගය කරයි.
- නාම ප්‍රකෘති, භාෂාවේ යෙදෙන අවස්ථා පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
- භාෂා භාවිතයේ දී නාම ප්‍රකෘති නිවැරදි ව භාවිත කරයි.

නිපුණතාව : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 6.2 ක්‍රියා පද හා එහි ප්‍රභේද පිළිබඳ අවබෝධයෙන් යුතු ව ලේඛන කාර්යයේ යෙදෙයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- ක්‍රියා පද වර්ග පිළිබඳ මතකය අවදි කරමින් සාකච්ඡා කරයි.
- වාක්‍යයක අවසාන ක්‍රියාව පැහැදිලි කරයි.
- වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය, කාල භේදය ආදි වශයෙන් අවසාන ක්‍රියාව යෙදෙන අයුරු දක්වයි.
- වාක්‍ය නිර්මාණයේ දී ක්‍රියා පදයේ ඉහත අවස්ථා කෙරෙහි අවධානය යොමු කළ යුතු බව ප්‍රකාශ කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පූර්වක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා ආශිර්වාද ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා භාෂාවේ ව්‍යවහාර වන අයුරු නිදසුන් මගින් පැහැදිලි කරන්න.
- අවසාන ක්‍රියාව වචන, පුරුෂ, ලිංග, කාල ප්‍රභේද ආදි වශයෙන් විවිධතා ඇති බව නිදසුන් මගින් පැහැදිලි කරන්න.
- ඉගෙන ගත් අවසාන ක්‍රියා පිළිබඳ ව හැඳින්වීමක් කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- ක්‍රියා පද - ජේ. බී. දිසානායක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ක්‍රියා පද වර්ග නම් කරයි.
- ක්‍රියා පද නිවැරදි ව භාවිත කිරීම අගය කරයි.
- ක්‍රියා පද අර්ථවත් ව වාක්‍යවල යොදයි.
- ක්‍රියා පද නිවැරදි ව යොදමින් ලේඛනයේ යෙදෙයි.

නිපුණතාව : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 6.3 අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි.

කාලච්ඡේද : 4යි.

ඉගෙනුම් පල :

- අව්‍යය පද හඳුනාගෙන නම් කරයි.
- අව්‍යය පද නිපාත සහ උපසර්ග වශයෙන් වෙන් කර දක්වයි.
- උපසර්ග පද යෙදී ඇති වචන හඳුනාගෙන භාවිත කරයි.
- උපසර්ග වචනයක මුලට යෙදී, අර්ථ ප්‍රකාශ කරන බව පවසයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- අව්‍යය පද නිපාත, උපසර්ග වශයෙන් දෙයාකාර වන අයුරු පැහැදිලි කරන්න.
- නිපාත පද විවිධාර්ථවත් ව භාෂාවේ යෙදෙන ආකාරයත් තනි පදයත් වශයෙන් වාක්‍යයක මුල, මැද, අග වෙනසක් නොමැති ව යෙදෙන ආකාරයත් පැහැදිලි කරන්න.
- නිපාත පද පිළිබඳ සිහිපත් කර උපසර්ග පද වෙනස් වන ආකාරය හඳුන්වා දෙන්න. (භාෂාවේ යෙදෙන ආකාරය අනුව)
- මෙම උපසර්ග අතර සංස්කෘත භාෂාවෙහි යෙදෙන උපසර්ග ද භාවිත වන බව පෙන්වා දෙන්න.
- භාෂාවේ යෙදෙන උපසර්ග පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- උපසර්ග මගින් අර්ථ වෙනස් වන අයුරු පැහැදිලි කරන්න.
- නිපාත හා උපසර්ග පිළිබඳ කරුණු ගවේෂණයට සුදුසු පැවරුම් ඉදිරිපත් කරන්න.
- මේ සඳහා පෙළ පොතේ අව්‍යය පද පාඩම සම්බන්ධ කර ගන්න.
- පෙළපොතේ අභ්‍යාසවලට ද ශිෂ්‍යයන් යොමු කරන්න.

මූලික වදන් හා සංකල්ප :

- අව්‍යය පද : නිපාත සහ උපසර්ග

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- අව්‍යය පද හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි.
- උපසර්ග පද වචනවල අර්ථවත් ව භාවිත කරයි.
- ලේඛනයේ දී අව්‍යය පද නිවැරදි ව භාවිත කරයි.

නිපුණතාව : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 6.4 පද නිවැරදි ව සන්ධි කර දක්වයි.

කාලච්ඡේද : 05යි.

ඉගෙනුම් පල :

- භාෂාවේ සන්ධි යනු කුමක්දැයි පැහැදිලි කරයි.
- සන්ධි විධි හඳුනාගෙන නම් කරයි.
- භාෂාවේ ශබ්ද මූලික කර ගෙන සන්ධි කාර්ය සිදු වන බව ප්‍රකාශ කරයි.
- උච්චාරණයේ පහසුව සඳහා පද සන්ධි වන බව පවසයි.
- ලේඛනය සඳහා සන්ධි පද යොදා ගනියි.
- පද විසන්ධි කිරීමෙන් වචනාර්ථ දැන ගනියි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- වචන අතර සිදු වන සන්ධි කාර්යය පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- පද දෙකක ශබ්ද අතර සන්ධි කාර්යය සිදු වන බව පෙන්වා දෙන්න.
- භාෂාවේ යෙදෙන සන්ධි නම් කරන්න
- නිදසුන් සහිත ව සන්ධි විධි එකිනෙක පැහැදිලි කරන්න.
- පෙළ පොතේ සන්ධි විධි පාඩම යොදා ගන්න.
- පද විසන්ධි කිරීමෙන් වචනාර්ථ දැන ගැනීමට පහසු වන බව පෙන්වා දෙන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්ලිව්. එස්. කරුණාතිලක
- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- භාෂාවේ සන්ධි හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- පද නිවැරදි ව සන්ධි කිරීමේ හැකියාව අගය කරයි.
- පද නිවැරදි ව විසන්ධි කරමින් අර්ථ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- සන්ධි පද යොදාගෙන ව්‍යක්ත ලෙස භාෂාව භාවිත කරයි.

නිපුණතාව : 6.0 සම්මත භාෂා රීති අනුගමනය කරමින් ලේඛන කාර්යයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 6.5 සම්මත රීතිවලට අනුගත ව වාක්‍ය ලියයි.

කාලච්ඡේද : 4යි.

ඉගෙනුම් පල :

- විවිධ වාක්‍ය හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය නිවැරදි ව ලියයි.
- උක්තය කර්මය හා ආඛ්‍යාතය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි.
- කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය රීති අනුගමනය කරමින් නිවැරදි ව ලේඛනයේ යෙදෙයි.
- විවිධ රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- විවිධත්වයෙන් යුතු ව ලිවීම සඳහා විවිධ වාක්‍ය රීති භාවිත කිරීමට සිදු වන බව පෙන්වා දෙන්න.
- උක්ත කර්ම ආඛ්‍යාත පද සම්බන්ධය ප්‍රකට වන පරිදි වාක්‍ය නිර්මාණයට උපදෙස් දෙන්න.
- රීතිවලට අනුව වාක්‍ය නිර්මාණය කිරීම සඳහා නිදසුන් සහිත ව උපදෙස් දෙන්න.
- කර්තෘකාරක වාක්‍ය හා කර්මකාරක වාක්‍ය හඳුන්වන්න.
- කර්මකාරක වාක්‍යයේ විශේෂතා දක්වන්න.
- උක්ත අනුක්ත රූප භේදය හඳුන්වා දෙන්න.
- කර්මකාරක වාක්‍ය නිර්මාණය කිරීමේ දී කර්තෘ හා උක්ත වූ කර්මය අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න.
- කර්මකාරක වාක්‍ය නිර්මාණයට යොමු කරන්න.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලිවීමේ අභ්‍යාසවල යොදවන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල ලේඛන රීතිය - ජාතික අධ්‍යාපන ආයතනය
- සිංහල භාෂා ව්‍යාකරණය - ඩබ්. එස්. කරුණාතිලක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- විවිධ රීතිවලට අනුව වාක්‍ය ලිවීමේ හැකියාව අගය කරයි.
- කර්මකාරක වාක්‍ය නිර්මාණය කරයි.
- කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියයි.
- වාක්‍ය රීති හඳුනාගෙන ලේඛනයේ යෙදෙයි.

නිපුණතාව : 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 7.1 තොරතුරු සන්නිවේදනය සඳහා ලිපි ලියයි.

කාලච්ඡේද : 4යි.

ඉගෙනුම් පල :

- විවිධ ලිපි ආකෘති හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- ලිපියෙහි ව්‍යුහමය නිරවද්‍යතාව හා නිශ්චිත අරමුණකට යොමු වන බව පවසයි.
- ශිල්පීය ප්‍රයෝග උපයෝගි කර ගනිමින් ලියයි.
- ලිපි ලිවීමේ දී යෝග්‍ය ආකෘති භාවිත කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සුදුසු ක්‍රමවේද භාවිත කර රාජකාරි හා ව්‍යාපාරික ලිපි හඳුන්වා දෙන්න.
- ලිපි ආකෘති පැහැදිලි කරන්න.
- සාම්ප්‍රදායික පිළිවෙළට අනුව මෙන් ම නූතන ආකෘතියට අනුකූල ව ද ලිවිය හැකි බව පැහැදිලි කරන්න.
- ආචාරශීලී බව හා ශිල්පීය ප්‍රයෝග අනුගමනය කිරීම අත්‍යවශ්‍ය බව පෙන්වා දෙන්න.
- පැහැදිලි අත් අකුරු සහ ව්‍යාකරණානුකූල ව ලිවිය යුතු බව පෙන්වා දෙන්න.
- සම්මත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීමට උපදෙස් දෙන්න.
- ශිල්පීය ප්‍රයෝග භාවිත කර ලිපි ලිවීමේ ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍යයන් යොදවන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබඳු

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- රාජකාරි හා ව්‍යාපාරික ලිපි හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- ලිපි ලිවීමේ දී ඊට ආවේණික ආකෘති භාවිත කළ යුතු බව පිළිගනියි.
- ලිපි ලිවීමේ දී ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.
- තම සන්නිවේදන කටයුතු ඉටු කර ගැනීම සඳහා ලිපි ලියයි.

නිපුණතාව : 7.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 7.2 ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ලේඛන සකස් කරයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- ප්‍රායෝගික ලේඛන හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- ශිල්පීය ප්‍රයෝගානුකූල ව ප්‍රායෝගික ලේඛන සකස් කරයි.
- අදාළ ලේඛනයට යෝග්‍ය නිර්මාණාත්මක අංග භාවිත කරමින් ප්‍රායෝගික ලේඛනයේ යෙදෙයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ප්‍රායෝගික ලේඛන වර්ග හඳුන්වා දෙන්න.
- එක් එක් ලේඛනවලට ආවේනික ලක්ෂණ හා ඒවායේ උපයෝගිතාව පැහැදිලි කරන්න.
- නිරවුල් ව හා නිවැරදි ව ලිවීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- ප්‍රායෝගික ලේඛන

1. වාර්තා,
2. සටහන් (memo),
3. අත් පත්‍රිකා,
4. න්‍යාය පත්‍ර,
5. දැන්වීම්

- ශිෂ්‍යයන් ක්‍රියාකාරකමක නිරත කරවන්න.

මූලික වදන් හා සංකල්ප :

සටහන් (memo) ආයතනයක සිරස් අතට හෝ තිරස් අතට හෝ තොරතුරු සන්නිවේදනය සඳහා යොදා ගන්නා ලිපි.

ගුණාත්මක යෙදවුම් :

- පුවත්පත්, සමිති වාර්තා, අත්පත්‍රිකා න්‍යාය පත්‍ර හා විවිධ දැන්වීම්, සටහන් :පැපද*

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ප්‍රායෝගික ලේඛන වර්ග හඳුනාගෙන නම් කරයි.
- එක් එක් ලේඛන වර්ගවලට විශේෂිත වූ ලක්ෂණ ඇති බව පිළිගනියි.
- ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.
- විවිධ කාර්යයන් සඳහා අවශ්‍ය ලේඛන පිළියෙල කරයි.

නිපුණතාව : 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 8.1 කරුණු සංවිධානය කර ගනිමින් මාතෘකානුකූල ව රචනා ලියයි.

කාලච්ඡේද : 04යි.

ඉගෙනුම් පල :

- ලේඛනකරණයේ නිතරවීමට අපේක්ෂිත මාතෘකාවට අදාළ ව විචාරාත්මක, විමර්ශනාත්මක හා ගවේෂණාත්මක ව කරුණු ඒකරාශි කරයි.
- විචාරාත්මක , විමර්ශනාත්මක හා ගවේෂණාත්මක මාතෘකාවලට අදාළ ව කරුණු සංවිධානය කරමින් ලියයි.
- භාෂාත්මක යෙදුම් උචිත පරිදි භාවිත කරමින් ලියයි.
- සම්මත ව්‍යාකරණානුකූල ව ලේඛනයේ යෙදෙයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- රචනා සැකිල්ලක් සකස් කරන ආකාරය පැහැදිලි කරන්න.
- රචනා ලිවීම සඳහා සුදුසු තේමා තෝරා ගන්න.
- කරුණු රැස්කිරීමට මග පෙන්වන්න.
- රචනා සැකිල්ලක් සකස් කරන ආකාරය පැහැදිලි කරන්න.
- රචනාව සැලසුම් කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන්න.
- ශිල්පීය ප්‍රයෝග අනුගමනය කිරීමට යොමු කරන්න.
- රචනයේ දී සාම්ප්‍රදායික යෙදුම් හා භාෂා ප්‍රයෝග උචිත පරිදි යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කරවන්න.
- රචනා ලිවීම සඳහා අභ්‍යාසවල නිරත කරවන්න.

මූලික වදන් හා සංකල්ප :

- ශිල්පීය ප්‍රයෝග - විරාම ලකුණු, පද බෙදීම, ඡේද වෙන් කිරීම ආදිය
- භාෂාත්මක යෙදුම් - සුවිශේෂ ව අදහස් ප්‍රකාශ කරන භාෂා ව්‍යවහාර

ගුණාත්මක යෙදවුම් :

- පුවත් පත්, සඟරා

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- තොරතුරුවලට අදාළ ව ගැළපෙන මාතෘකා නිර්මාණය කරයි.
- අදහස් නිර්මාණාත්මක ව ඉදිරිපත් කළ හැකි බව පිළිගනියි.
- රචනා ලිවීමේ දී ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.
- කරුණු සංවිධානය කර ගනිමින් රචනා ලියයි.

නිපුණතාව : 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 8.2 පාඨකයා ආකර්ෂණය වන පරිදි අදහස් ඉදිරිපත් කරමින් නිර්මාණාත්මක ව ලියයි.

කාලච්ඡේද : 03යි.

ඉගෙනුම් පල :

- විචාරාත්මක, විමර්ශනාත්මක හා ගවේෂණාත්මක මාතෘකාවලට අදාළ ව කරුණු සංවිධානය කර ගනිමින් විශේෂාංග ලිපි ලියයි.
- ලේඛනයේ දී භාෂාත්මක යෙදුම් උචිත පරිදි භාවිත කරයි.
- සම්මත ව්‍යාකරණානුකූල ව ලේඛනයේ යෙදෙයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පුවත් පත් විශේෂාංග ලිපි සඳහා සුදුසු මාතෘකා සාකච්ඡා කරන්න.
- පුවත් පත් විශේෂාංග ලිපිවල අන්තර්ගතය පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- විශේෂාංග ලිපි සඳහා සුදුසු මාතෘකා ලබා දෙන්න.
- විශේෂාංග ලිපි ලිවීමට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- විශේෂාංග ලිපි

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- විශේෂාංග ලිපි සඳහා සුදුසු මාතෘකා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- විශේෂාංග ලිපි ලිවීමේ අවශ්‍යතාව අගය කරමින් කතා කරයි.
- ලේඛනයේ දී ශිල්පීය ප්‍රයෝග භාවිත කරයි.
- අවස්ථෝචිත ව කරුණු සංවිධානය කර ගනිමින් විශේෂාංග ලිපි ලියයි.

නිපුණතාව : 8.0 භාෂාව නිරවුල් ව හා නිවැරදි ව භාවිත කරමින් නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 8.3 සංස්ලේෂණ හැකියා ප්‍රදර්ශනය කරමින් සාරාංශකරණයේ යෙදෙයි.

කාලච්ඡේද : 3යි.

ඉගෙනුම් පල :

- ලේඛන අවබෝධයෙන් යුතු ව කියවයි.
- වැදගත් කරුණු සටහන් කර ගනියි.
- සාරාංශකරණ මූලධර්ම විස්තර කරයි.
- කියවීමෙන් ග්‍රහණය කර ගත් කරුණු සාරාංශකරණ මූලධර්මවලට අනුකූල ව සංක්ෂිප්ත කර ඉදිරිපත් කරයි.
- අදහස් සංක්ෂිප්ත කරමින් ලියයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සාරාංශකරණයේ වැදගත්කම පැහැදිලි කරන්න.
- සාරාංශකරණයේ දී අවධානය යොමු කළ යුතු කරුණු හඳුන්වා දෙන්න.
- ලේඛනය අවබෝධයෙන් යුතු ව කිහිප වාරයක් කියවා ගැනීමට සලස්වන්න.
- ලේඛනයේ වැදගත් කරුණු සටහන් කර ගැනීමට යොමු කරන්න.
- මුල් ලේඛනයේ අදහසට හානි නොවන අයුරින් ග්‍රහණය කර ගත් අදහස අර්ථවත් ව සාරාංශ කිරීමට යොමු කරන්න.
- දෙන ලද ඡේදයෙන් තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කිරීමට උපදෙස් දෙන්න.
- ශිෂ්‍යයන් සාරාංංශකරණ අභ්‍යාසයක නිරත කරවන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සිංහල රචනය හා සාහිත්‍ය රසාස්වාදය - පී. තේනබදු

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ලේඛන කියවා අදහස් තේරුම් ගනියි.
- සාරාංශකරණ හැකියාව අගය කරයි.
- සාරාංශකරණය සඳහා ශිල්පීය දැනුම භාවිත කරයි.
- සාරාංශකරණයේ යෙදෙයි.

නිපුණතාව : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනාගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 9.1 සංස්කෘතික උරුමය හා හර පද්ධති පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා කියවයි.

කාලච්ඡේද : 2යි.

ඉගෙනුම් පල :

- නිර්දිෂ්ට ලේඛන කියවා සංස්කෘතික උරුමය පිළිබඳ අදහස් දක්වයි.
- සංස්කෘතිකාංගවලින් ඉස්මතු වන සාරධර්ම විස්තර කරයි.
- සංස්කෘතික උරුමය රැක ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සංස්කෘතික උරුමය ඇතුළත් පෙළ පොතේ පාඩම කියවන්න.
- පාඩම ඇසුරෙන් සංස්කෘතික උරුමය හර පද්ධති පිළිබඳ සාකච්ඡා කරන්න.
- සංස්කෘතික උරුමය ඉස්මතු වන වෙනත් අවස්ථා හඳුනාගැනීමට අවස්ථාව සලස්වන්න.
- පාඩමට අදාළ අභ්‍යාසයෙහි යොදවන්න.
- අපේ සංස්කෘතික උරුමය විදහා දැක්වෙන පොත් පිංචක් සකස් කිරීමට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- අපේ සංස්කෘතික උරුමය 1 - මධ්‍යම සංස්කෘතික අරමුදල සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- අපේ සංස්කෘතික උරුමය 11 - සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
- සිංහල ලකුණ - මාර්ටින් වික්‍රමසිංහ

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සංස්කෘතික උරුමය පිළිබඳ ව තම අදහස් ඉදිරිපත් කරයි.
- සංස්කෘතිය හා බැඳුණු විවිධ චාරිත්‍ර වාරිත්‍ර පැහැදිලි කරයි.
- සංස්කෘතික උරුමය ආරක්ෂා කර ගැනීමට යොමු වෙයි.
- සංස්කෘතිකාංග අගය කරයි.

නිපුණතාව : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනාගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 9.2 පොතපත පරිශීලනයෙන් සාරධර්ම වර්ධනය කර ගනියි.

කාලච්ඡේද : 3යි.

ඉගෙනුම් පල :

- ජන ජීවිතය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- හේන් ගොවිතැන හා බැඳුණු සිරිත් විරිත් විස්තර කරයි.
- සාම්ප්‍රදායික වෘත්ති හා බැඳුණු සාරධර්ම අගය කරයි.
- විවිධ වෘත්ති හා සම්බන්ධ සිරිත් පැහැදිලි කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- ගැමි ජනතාව නියැළී සිටින විවිධ වෘත්ති පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- හේන් ගොවිතැන පිළිබඳ ව තොරතුරු පැහැදිලි කරන්න.
- එම සිරිත් විරිත්වල වටිනාකම හඳුනාගැනීමට සලස්වන්න.
- අවස්ථෝචිත ව සිරිත් අනුගමනය කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න.
- හේන් ගොවිතැන හා බැඳුණු විවිධ චාරිත්‍ර වාරිත්‍ර හඳුනා ගැනීමට සලස්වන්න.
- අවස්ථෝචිත ව සිරිත් අනුගමනය කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න.
- හේන් ගොවිතැන හා බැඳුණු වචන භාෂාවේ යෙදීම සඳහා අභ්‍යාසවල ශිෂ්‍යයන් නිරත කරවන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- හේන් විත්ති - ඇන් ටී. කරුණාතිලක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- විවිධ වෘත්ති හා බැඳුණු සිරිත් විරිත් ප්‍රකාශ කරයි.
- ගැමි සංස්කෘතිය හඳුනාගෙන පැහැදිලි කරයි.
- සිරිත් විරිත් අනුගමනය කිරීම අගය කරයි.
- යහ ගැමි සිරිත් පුරුදු පුහුණු වෙයි.

නිපුණතාව : 9.2 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 9.3 දේශාභිමානී හැඟීම් දනවන නිර්මාණ ඇසුරු කරයි.

කාලච්ඡේද : 3යි.

ඉගෙනුම් පල :

- දේශාභිමානී හැඟීම් දනවන පද්‍ය හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- දේශාභිමානය දනවන යෙදුම් පැහැදිලි කරයි.
- දේශාභිමානී හැඟීම් දනවන යෙදුම් අර්ථවත් ව භාෂාවේ භාවිත කරයි.
- දේශාභිමානී පද්‍ය අගය කරමින් කතා කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පi පන්තිය සිසුන් ලවා ගායනය කරවන්න.
- පi පන්තියෙන් ධ්වනිත වන අදහස් පැහැදිලි කරන්න.
- කවියා යොදා ගෙන ඇති කාව්‍ය උපක්‍රම පිළිබඳ ව අවධානය යොමු කරන්න.
- දේශාභිමානය දැනවීම සඳහා කාව්‍යෝපක්‍රම යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.
- පi පන්තිය කියවීමෙන් ඇති වන දේශාභිමානි හැඟීම් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- රත්න දීප ජන්ම භූමි - මහගම සේකර
- ජාතික තොටිල්ල - එස් මහින්ද හිමි

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- දේශාභිමානි හැඟීම් දනවන පද්‍ය හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- දේශාභිමානය දනවන පද්‍ය අගය කරයි.
- දේශාභිමානය දනවන පද්‍ය කියවා රස විඳියි.
- දේශාභිමානයෙන් යුක්ත ව කටයුතු කරයි.

නිපුණතාව : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 9.4 විවිධ ජන කොටස්වලට අයත් සිරිත් විරිත් හඳුනාගැනීම සඳහා කියවයි.

කාලච්ඡේද : 2යි.

ඉගෙනුම් පල :

- පොත පත පරිශීලනයෙන් හඳුනාගත් හින්දු සිරිත් විරිත් පැහැදිලි කරයි.
- හින්දු සිරිත් විරිත් පිළිබඳව අදහස් ප්‍රකාශ කරයි.
- හින්දු සිරිත් විරිත් පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- හින්දු ආගම පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- ඒ අනුව හින්දු සිරිත් විරිත් පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.
- හින්දු සංස්කෘතික සිරිත් විරිත් පිළිබඳ අවබෝධයෙන් යුතු ව සහජීවනයෙන් කටයුතු කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.
- හින්දු සිරිත් විරිත් පිළිබඳ අදහස් දැක්වීමට සිසුන් යොමු කරවන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- ස්කන්ධ පුරාණය - දීපවාලිය ආරම්භය පිළිබඳ කතා පුවත

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- හින්දු සිරිත් විරිත් හඳුනගත හැකි අවස්ථා නම් කරයි.
- හින්දූන්ගේ යහ සිරිත් අගය කරයි.
- එම සිරිත් විරිත්වල වැදගත්කම පැහැදිලි කරයි.
- හින්දු උත්සවවලට සහභාගි වෙමින් සහජීවනයෙන් කටයුතු කරයි.

නිපුණතාව : 9.0 සංස්කෘතිය හා සාරධර්ම හඳුනා ගනිමින් සහජීවනය හා ජාතිකාභිමානය ගොඩනගා ගැනීම සඳහා භාෂාව භාවිත කරයි.

නිපුණතා මට්ටම : 9.5 විවිධ ආගමික නායකයන්ගේ චරිත කතා පරිශීලනය කරයි.

කාලච්ඡේද : 2යි.

ඉගෙනුම් පල :

- ඉස්ලාම් නායකයකු පිළිබඳ තොරතුරු විස්තර කරයි.
- නායකයාගේ සුවිශේෂ චරිත ලක්ෂණ ඉදිරිපත් කරයි.
- ඔහුගෙන් ඉටු වූ ජාතික මෙහෙවර අගය කරමින් කතා කරයි.

පාඩම් සැලසුම සඳහා උපදෙස් :

- පෙළපොතේ පාඩම කියවීමට සිසුන් යොමු කරන්න.
- ඉස්ලාම් නායකයා පිළිබඳ තොරතුරු සාකච්ඡා කරන්න.
- එතුමාගෙන් එම ආගමට හා සමාජයට ඉටු වූ සුවිශේෂ සේවාව පැහැදිලි කරන්න.
- එතුමාගේ ජාතික මෙහෙවර පැහැදිලි කරන්න.
- එතුමාගේ චරිතයෙන් ලබාගත හැකි ජීවිතාදර්ශ ගැන සාකච්ඡා කරන්න.
- එම ජීවිතාදර්ශ පිළිබඳ සිසුන්ගෙන් අදහස් ලබා ගන්න.

ගුණාත්මක යෙදවුම් :

- ඉස්ලාම් නායකයාගේ ඡායාරූපයක්

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- ඉස්ලාම් නායකයකු හඳුනාගෙන නම් කරයි.
- ඔහුගේ චරිත ලක්ෂණ අගය කරයි.
- එතුමා සමාජයට ඉටු කළ සේවය පැහැදිලි කරයි.
- ආගමික සහජීවනයෙන් යුක්ත ව කටයුතු කරයි.

නිපුණතාව :10.0 සාහිත්‍යික, දාර්ශනික, විාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්ය සඳහා යොදා ගනියි.

නිපුණතා මට්ටම : 10.1 සාහිත්‍යික හා දාර්ශනික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන ඇසුරු කරයි.

කාලච්ඡේද : 3යි.

ඉගෙනුම් පල :

- ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර චරිතය හඳුනා ගෙන එම තොරතුරු ඉදිරිපත් කරයි.
- කන්නන්ගර මහතාගේ දාර්ශනික අදහස් අගය කරමින් අදහස් දක්වයි.
- කන්නන්ගර මැතිතුමාගෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු වූ සේවය විස්තර කරයි.

පාඩම සැලසුම කිරීම සඳහා උපදෙස් :

- පෙළපොතේ පාඩම කියවීමට ශිෂ්‍යයන් යොමු කරන්න.
- ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර චරිතය හඳුනාගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- එතුමා අධ්‍යාපනය හා සම්බන්ධ ව ඉදිරිපත් කළ දාර්ශනික අදහස් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- නිදහස් අධ්‍යාපනය යනු කුමක් දැයි පැහැදිලි කර ඒ සඳහා කන්නන්ගර මැතිතුමාගේ කැපවීම කෙබඳු දැයි පැහැදිලි කරන්න.
- කන්නන්ගර චරිතයෙන් ලබාගත හැකි ජීවිතාදර්ශ ගැන සාකච්ඡා කරන්න.
- පෙළපොතේ අභ්‍යාස සඳහා සිසුන් නිරත කරවන්න.
- කන්නන්ගර චරිත ලක්ෂණ වගු ගත කිරිමට සිසුන් යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- ආචාර්ය සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර අනුස්මරණ දේශන (ජාතික අධ්‍යාපන ආයතනය)
- එතුමාගේ ඡායාරූපයක්
- අධ්‍යාපන සියවස ප්‍රකාශනය II කාණ්ඩය
- පූජිත ජීවිත I - IV

ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස් :

- කන්නන්ගර මහතා නිදහස් අධ්‍යාපනය සඳහා කැපවූ විද්වතකු වශයෙන් හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- අධ්‍යාපනය පිළිබඳ එතුමාගේ දර්ශනය අගය කරයි.
- නිදහස් අධ්‍යාපනයේ වටිනාකම පැහැදිලි කරයි.
- එතුමාගෙන් අධ්‍යාපන කේෂ්ත්‍රයට සිදු වූ සේවාව පැහැදිලි කරයි.
- කන්නන්ගර චරිතය චරිතායනය කර ගනියි.

නිපුණතාව : 10.0 සාහිත්‍යය, දාර්ශනික, විචාරාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්ය සඳහා යොදා ගනියි.

නිපුණතා මට්ටම : 10.2 දැනුම ලබා ගැනීම සඳහා විචාරාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොත පත පරිශීලනය කරයි.

කාලච්ඡේද : 3යි.

ඉගෙනුම් පල :

- පුරාණ ලාංකේය ගෘහ නිර්මාණ හඳුනාගෙන නම් කරයි.
- පැරණි ගෘහ නිර්මාණ තාක්ෂණය පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කරයි.
- පැරණි ගොඩනැගිලිවල සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- පැරණි ගොඩනැගිලිවල වටිනාකම අගයමින් කතා කරයි.

පාඩම් සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- පැරණි ලාංකේය ගෘහ නිර්මාණ පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක යෙදෙන්න.
- එම ගොඩනැගිලි නිර්මාණය කිරීමේ අවශ්‍යතා මොනවාදැයි පෙන්වා දෙන්න.
- එම ගොඩනැගිලි නිර්මාණය කිරීමේ දී යොදා ගෙන ඇති අංග හා තාක්ෂණය පිළිබඳ ව කරුණු ගවේෂණයට යොමු කරන්න.
- පැරණි ගොඩනැගිලි තාක්ෂණය පිළිබඳ ලියැවුණු පොතපත කියවීමට යොමු කරන්න.
- ඒ හා සම්බන්ධ භාෂාත්මක යෙදුම් අර්ථවත් ව භාවිතයට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- පැරණි ගෘහ නිර්මාණ පිළිබඳව ලියවුණු ලිපි ලේඛන.

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- පැරණි ගෘහ නිර්මාණ තාක්ෂණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ගෘහ නිර්මාණ තාක්ෂණයෙහි විවිධ ලක්ෂණ අගය කරයි.
- ගොඩනැගිලිවල විවිධත්වය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- ගෘහ නිර්මාණ හා බැඳුණු භාෂාත්මක වචන අර්ථවත් ව භාවිත කරයි.
- පැරණි ගෘහ නිර්මාණ තාක්ෂණය අගය කරයි.

නිපුණතාව : 10.0 සාහිත්‍යයික, දාර්ශනික, විiාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් ලිපි ලේඛන පරිශීලනයෙන් ලබා ගත් දැනුම විවිධ භාෂා කාර්ය සඳහා යොදා ගනියි.

නිපුණතා මට්ටම : 10.3 අiතන සාහිත්‍ය නිර්මාණවලින් ප්‍රකට වන සුවිශේෂතා හඳුනාගෙන බස හසුරුවයි.

කාලච්ඡේද : 4යි.

ඉගෙනුම් පල :

- අiතන සාහිත්‍ය නිර්මාණ කියවා ඒවායේ අන්තර්ගතය පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි.
- සාහිත්‍ය නිර්මාණයක අන්තර්ගතයෙන් නිරූපණය වන සුවිශේෂතා විචාරාත්මක ව ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය නිර්මාණවල දී විවිධත්වයෙන් යුතු ව භාෂාව භාවිත කිරීම අගය කරමින් කතා කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සාහිත්‍ය නිර්මාණ හා විචාරය පිළිබඳ ව හැඳින්වීමක් කරන්න.
- සාහිත්‍යමය ලේඛනවල විවිධත්වය අනුව භාෂාවෙහි ද විවිධතා දක්නට ලැබෙන බව නිදසුන් සහිත ව පෙන්වා දෙන්න.
- නිර්මාණවල සාර්ථකත්වය සඳහා භාෂාව බලපා ඇති ආකාරය හඳුනාගැනීමට විවිධ සාහිත්‍ය නිර්මාණ යොදා ගෙන සාකච්ඡාවක නිරතවන්න.
- භාෂාවේ ස්වරූපය හඳුනාගෙන නිර්මාණාත්මක ලේඛන කියවා විචාරයේ යෙදීමට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

- ගණිසුරු විදුලිය පන්දම - කුමාරතුංග මුනිදාස
- අලි උවදුර - කුමාරතුංග මුනිදාස

ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සාහිත්‍ය නිර්මාණ කියවා අන්තර්ගතය විස්තර කරයි.
- සිංහල සාහිත්‍ය නිර්මාණවල භාෂාව කලාත්මක ලෙස හසුරුවා ඇති අයුරු අගය කරයි.
- භාෂා භාවිතය පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය නිර්මාණය පිළිබඳ තම අදහස් ප්‍රකාශ කරයි.
- සාහිත්‍ය නිර්මාණ විචාරයට ලක් කරයි.

නිපුණතාව : 11. රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

නිපුණතා මට්ටම : 11.1 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් හඳුනාගත් මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.

කාලච්ඡේද : 3යි

ඉගෙනුම් පල :

- සාහිත්‍ය නිර්මාණය කියවා ලබන මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.
- සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් ලත් ජීවිතාබෝධය පිළිබඳ අදහස් දක්වයි.
- මානව අත්දැකීම් සාහිත්‍ය නිර්මාණවලට යොදා ගෙන ඇති ආකාරය පැහැදිලි කරයි.
- කෙටි කතාව, සන්දේශ කාව්‍ය හා පද්‍ය නිර්මාණ, රසාස්වාදයේ යෙදෙයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- මෙම පාඩම සඳහා සන්දේශ කාව්‍ය හා තොරොක්කෝව කෙටිකතාව පාඩම පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- පද්‍ය නිර්මාණවල දී මානව අත්දැකීම් හඳුනා ගැනීමට යොමු කරන්න.
- තොරොක්කෝව කෙටිකතාවේ මානව අත්දැකීම් හඳුනාගැනීමට සලස්වන්න. ඒ සඳහා ශිෂ්‍යයන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එහිදී ශිෂ්‍යයන් ලැබූ අත්දැකීම් සාකච්ඡා කරන්න.
- ළමා අත්දැකීමක් වශයෙන් එහි අගය සාකච්ඡා කරන්න.
- ශිෂ්‍යයන් කණ්ඩායම් දෙකකට වෙන් කර නිර්මාණ දෙක ම රසවින්දනයට අවස්ථාව ලබාදෙන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා
නිර්මාණ පසුබිම - ඒ. වී. සුරවීර
සාහිත්‍ය විචාර සටහන් - කේ. ජයතිලක
නිර්මාණය හා විචාරය - විමල් දිසානායක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- සාහිත්‍ය නිර්මාණ සඳහා පාදක අත්දැකීම් ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය නිර්මාණවලින් හෙළිවන මානව අත්දැකීම් ප්‍රකාශ කරයි.
- සාහිත්‍ය නිර්මාණවලින් ලබන ජීවිතාවබෝධය ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය නිර්මාණ පරිශීලනයට යොමු වෙයි.
- සාහිත්‍ය නිර්මාණ රසවින්දනයට යොමු වෙයි.

නිපුණතාව : 11 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

නිපුණතා මට්ටම : 11.2 සාහිත්‍ය නිර්මාණ රසාස්වාදයේ යෙදෙයි.

කාලච්ඡේද : 3යි.

ඉගෙනුම් පල :

- පද්‍ය නිර්මාණ ගායනය කරමින් රසවිඳියි.
- සාහිත්‍ය නිර්මාණවල අන්තර්ගතය හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය නිර්මාණවල කාව්‍යෝපක්‍රම හා ශිල්ප ක්‍රම භාවිත කර ඇති ආකාරය විමර්ශනය කරයි.
- රසාස්වාදය සඳහා සාහිත්‍ය නිර්මාණ ඇසුරු කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සාහිත්‍ය නිර්මාණය අයත් මුල් කෘතිය හා එහි සාහිත්‍ය පසුබිම සාකච්ඡා කරන්න.
- පද්‍ය නිර්මාණ ගායනය කිරීමට සලස්වන්න.
- පai පන්තිවල අර්ථය පැහැදිලි කරන්න.
- කවියා යොදා ගෙන ඇති කාව්‍යෝපක්‍රම සාකච්ඡා කරන්න. (උපමා, රූපක, අනුප්‍රාස, ධ්වනිතාර්ථ, එළිසමය, ව්‍යංග්‍යාර්ථ, සංකල්පරූප ආදිය.)
- පai පන්තිය රසාස්වාදයේ යෙදීමට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- වෙසතුරු දා කාව්‍ය ග්‍රන්ථයේ තෝරාගත් කවිවලට අමතර ව තෝරාගත් තවත් රසවත් කවි

ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- රසවත් පද්‍ය නිර්මාණ හඳුනාගැනීමේ ශක්‍යතාව ප්‍රදර්ශනය කරයි.
- පද්‍ය නිර්මාණ කියවා අගය කරයි.
- කාව්‍යෝපක්‍රම හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය නිර්මාණ රසවත්වීමට හේතු දක්වයි.
- රසාස්වාදය කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

නිපුණතාව : 11 රසඥතා වර්ධනය සඳහා සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කරයි.

නිපුණතා මට්ටම : 11.3 සාහිත්‍ය නිර්මාණ අධ්‍යයනය කර විචාර හැකියා ප්‍රදර්ශනය කරයි.

කාලච්ඡේද : 4යි.

ඉගෙනුම් පල :

- සාහිත්‍ය නිර්මාණ කියවයි.
- සාහිත්‍ය නිර්මාණ පිළිබඳ අදහස් දක්වයි.
- විවිධ සාහිත්‍ය නිර්මාණ කියවා විචාරයේ යෙදෙයි.
- සාහිත්‍ය රස වින්දනයේ යෙදෙයි.

පාඩම සැලසුම්කිරීම සඳහා උපදෙස් :

- සාහිත්‍ය නිර්මාණ විචාරය කිරීමේ දී විචාර මූලධර්ම පිළිබඳ දැනුමක් අවශ්‍ය බව පැහැදිලි කරන්න.
- සාහිත්‍ය මූලධර්ම පිළිබඳ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- සාහිත්‍ය පිළිබඳ දැනුම පුළුල් කර ගැනීමේ අවශ්‍යතාව ඉදිරිපත් කරන්න.
- විචාරය සඳහා උචිත භාෂා ව්‍යවහාරයක් භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.
- විවිධ සාහිත්‍ය නිර්මාණ රසාස්වාදය කිරීමට යොමු කරන්න.
- සාහිත්‍යය විචාරයේ යෙදීමට යොමු කරන්න.
- සාහිත්‍ය උධෘතයක් ලබාදී විචාරයට ශිෂ්‍යයන් යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- සාහිත්‍ය විචාර සටහන් - කේ. ජයතිලක මයා
- සාහිත්‍ය විiාව - එදිරිවීර සරච්චන්ද්‍ර
- සාහිත්‍ය විචාර ප්‍රදීපිකා - ඒ. වී. සුරවීර

ඇගයීම තක්සේරුකරණය සඳහා උපදෙස්

- උසස් සාහිත්‍ය නිර්මාණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- සාහිත්‍ය නිර්මාණ ඇසුරු කිරීම අගය කරයි.
- සාහිත්‍ය නිර්මාණ කියවා විචාරාත්මක ව අදහස් පළ කරයි.
- සාහිත්‍ය විචාර හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතාව : 12.0 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 12.1 පද්‍ය නිර්මාණය කරයි.

කාලච්ඡේද : 03යි.

ඉගෙනුම් පල :

- නිර්මාණය සඳහා පදනම් වූ අත්දැකීම් ඉදිරිපත් කරයි.
- පද්‍ය නිර්මාණය කිරීමේ දී නිර්මාණාත්මක ව චින්තනය මෙහෙය විය යුතු බව ප්‍රකාශ කරයි.
- පද්‍ය නිර්මාණයේ දී යොදාගත හැකි විවිධ කාව්‍යෝපක්‍රම පිළිබඳ ව අදහස් දක්වයි.
- පද්‍ය නිර්මාණයේ යෙදෙයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- සරල පද්‍ය නිර්මාණයක් ඇසුරෙන් පද්‍ය නිර්මාණකරණයට පෙලඹවීමක් කරන්න.
- සරල පද්‍ය නිර්මාණ කිහිපයක් ඉදිරිපත් කර එම පද්‍ය නිර්මාණය කිරීමේ දී භාෂාව, උපමා රූපක ආදි කාව්‍ය උපක්‍රම යොදා ගෙන ඇති ආකාරය සාකච්ඡා කරන්න.
- පද්‍ය නිර්මාණවලට උචිත තේමාවක් තෝරා ගැනීමට යොමු කරන්න.
- කාව්‍ය නිර්මාණයේ දී අභිමත කාව්‍ය සම්ප්‍රදායක් අනුගමනය කිරීමට නිදහස ලබා දෙන්න.
- කාව්‍ය උපක්‍රම භාවිත කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්න.
- කාව්‍ය නිර්මාණ සඳහා උදාහරණ කීපයක් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- කාව්‍ය නිර්මාණකරණයට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම්

- 'නැළවිල්ල' - කුමාරතුංග මුනිදාස
- ගඟ - ආනන්ද රාජකරුණා

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්

- පද්‍ය නිර්මාණය සඳහා උචිත අත්දැකීම් හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- උචිත කාව්‍යෝපක්‍රම භාවිත කරමින් පද්‍ය නිර්මාණය කරයි.
- පද්‍ය නිර්මාණයට සෙසු අය උනන්දු කරවයි.
- පද්‍ය නිර්මාණය කිරීමේ හැකියාව අගය කරයි.

.

.

නිපුණතාව : 12 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරණයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 12.2 නිර්මාණාත්මක ප්‍රබන්ධකරණයේ යෙදෙයි.

කාලච්ඡේද : 3යි.

ඉගෙනුම් පල :

- නිර්මාණකරණය සඳහා වූ අත්දැකීම් ඉදිරිපත් කරයි.
- ප්‍රබන්ධ නිර්මාණය කිරීමේ දී නිර්මාණාත්මක ව චින්තනය මෙහෙය විය යුතු බව ප්‍රකාශ කරයි.
- ප්‍රබන්ධකරණයේ දී විවිධ රචනෝපක්‍රම භාවිත කිරීම පිළිබඳ ව අදහස් ප්‍රකාශ කරයි.
- ප්‍රබන්ධ නිර්මාණකරණයේ යෙදෙයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- මං තනන්නෝ කෙටි කතාව කියවීමට සලස්වා කෙටි කතාව පිළිබඳ සාකච්ඡා කරන්න.
- කෙටි කතාවක ලක්ෂණ ශිෂ්‍යයන් සමග සාකච්ඡා කරන්න.
- මං තනන්නෝ කෙටි කතාව ඇසුරින් කෙටි හා ප්‍රබල සිද්ධි නිරූපණය වී ඇති ආකාරය සාකච්ඡා කරන්න.
- අවස්ථාව හා සිද්ධි ප්‍රබල ව ඉදිරිපත් කර ඇති ආකාරය මං තනන්නෝ කෙටි කතාව ඇසුරෙන් පැහැදිලි කරන්න.
- කෙටි කතාවක චරිත නිරූපණය ඉතා වැදගත් වන බව පෙන්වා දෙන්න.
- ප්‍රධාන චරිතය ගැඹුරින් නිරූපණය කිරීමේ අවශ්‍යතාව දක්වන්න.
- ඒ අනුව කෙටිකතාවක් නිර්මාණය කිරීමට යොමු කරන්න.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- නිර්මාණ පසුබිම - ඒ. වී. සුරවීර
- 'මං තනන්නෝ' කෙටි කතාව - මහගමසේකර
- 'බයිසිකලය' කෙටි කතාව - ජී. බී. සේනානායක

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- කෙටිකතා නිර්මාණය සඳහා උචිත අත්දැකීම් හඳුනාගෙන ඉදිරිපත් කරයි.
- කෙටිකතා නම් සාහිත්‍ය අංගය අගය කරයි.
- කෙටිකතා ලක්ෂණ හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- කෙටිකතා ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව කෙටිකතා නිර්මාණය කරයි.

නිපුණතාව : 12 අත්දැකීම් පාදක කර ගනිමින් නිර්මාණකරනයේ යෙදෙයි.

නිපුණතා මට්ටම : 12.3 නාට්‍ය පිටපත් රචනයේ යෙදෙයි.

කාලච්ඡේද : 3යි.

ඉගෙනුම් පල :

- උචිත කතා වස්තුවක් හඳුනා ගැනීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.
- එහි නාට්‍යෝචිත අවස්ථා පැහැදිලි කරයි.
- නාට්‍යයට උචිත අයුරින් සිද්ධි සංවිධානය කරයි.
- උචිත පරිදි දෙබස් ගොඩ නගමින් චරිත හසුරුවයි.
- නාට්‍ය පිටපතක් රචනා කරයි.

පාඩම සැලසුම් කිරීම සඳහා උපදෙස් :

- නට්‍යයක් සඳහා උචිත කතා වස්තුවක් තෝරා ගැනීමට යොමු කරන්න.
- තෝරාගත් කතා වස්තුව ඇසුරින් නාට්‍යෝචිත අවස්ථා ඉස්මතු කර ගැනීමට යොමු කරන්න.
- නාට්‍ය පිටපතක් රචනා කරන අයුරු සාකච්ඡා කරන්න.
- නාට්‍යයේ ගැටුම කුළු ගැන්වෙන පරිදි සිද්ධි ගොනු කිරීමට යොමු කරන්න.
- උචිත පරිදි දෙබස් ගොඩ නගමින් නිර්මාණය කළ නාට්‍ය පිටපතක් සිසුන් ලවා රඟ දක්වන්න.

මූලික වදන් හා සංකල්ප :

- නාට්‍යෝචිත අවස්ථා : නාට්‍යයක් විකාශනය වන්නේ ගැටුම් පදනම් කරගෙන ය. එවැනි ගැටුම් සහිත කතා වස්තු නාට්‍ය සඳහා පාදක කර ගැනේ. එවැනි ගැටුම් සහිත අවස්ථා නාට්‍යෝචිත අවස්ථා නම් වේ.

ගුණාත්මක යෙදවුම් :

ගුරු භවතාගේ පරිශීලනය සඳහා

- 'හිම කුමාරි' (සෝමලතා සුබසිංහ) කොටසක්.
- 'නරි බෑනා' (දයානන්ද ගුණවර්ධන)

ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :

- නාට්‍යෝචිත අවස්ථා සහිත කතාවස්තුවක් තෝරා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- නාට්‍යෝචිත දෙබස් හැසිරවීමේ හැකියාව අගය කරයි.
- නට්‍යෝචිත අවස්ථා උචිත පරිදි පෙළ ගස්වයි.
- නාට්‍යෝචිත පරිදි දෙබස් හසුරුවමින් නාට්‍ය පිටපතක් නිර්මාණය කරයි.

විවිධ සහාය : ඒ. රාජපක්ෂ මහත්මිය
නිලූපා අබේරත්න මහත්මිය
උපාලි ජයලත් මහතා